# රණවිරුවා

2024 නොවැම්බර් • 271 කලාපය



## විරිය පිරි දරුවන් සිරිය පෙන්නු දිනක්...

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.



# ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ධුරයේ රාජකාරී අරඹමින්

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ඉකුත් නොවැම්බර් මස 22 වන දින අකුරේගොඩ පිහිටි ආරක්ෂක අමාත්‍යාංශයේ දී සිය ධුරයේ රාජකාරී භාර ගත්තේය. ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ. එහිදී, අමාත්‍යාංශයේ දැනට ක්‍රියාත්මක සහ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත කටයුතු පිළිබඳ සාකච්ඡාවක් ද සිදුකළ ජනාධිපතිතුමන් නව රජය යහපත් ආණ්ඩුකරණයක් වෙනුවෙන් කැපවී සිටින බවත්, ජාතියේ සංවර්ධන වැඩපිළිවෙල සඳහා සියලු දෙනාගේම සහයෝගය අපේක්ෂා කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළේය.









# විරුවන් නමට පිපි පොපිමල් සැමරුම

ලෝක පොපිමල් දින නිමිත්තෙන් වූ රණවිරු සැමරුම් උත්සවය ඉකුත් නොවැම්බර් මස 24 වන දින කොළඹ විහාර මහා දේවි උද්‍යානයේ පිහිටි රණවිරු ස්මාරකය අභියස දී පැවැත්විණ. එම අවස්ථාවට ශ්‍රී ලංකා සේවා මුක්ත හට සංගමයේ ප්‍රධාන ලේකම් ලුතිනන් කර්නල් අජිත් සියඹලාපිටිය (විශ්‍රාමික) ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ සන්නද්ධ හමුදා සේනාධිනායක ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී විය.




ලෝක යුද සංග්‍රාමවල දී මෙන්ම මෙරට යුද්ධය හමුවේ දිවිපිදූ රණවිරුවන් ඇතුළු ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්හි මාතෘ භූමියේ ආරක්ෂාව වෙනුවෙන් උපරිම කැපකිරීම් කළ රණවිරුවන් සිහිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා සේවා මුක්ත හට සංගමය, ත්‍රිවිධ හමුදාව සමඟ එක්ව මෙම උත්සවය සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු, විදේශීය තානාපතිවරු, ශ්‍රී ලංකා සේවා මුක්ත හට සංගමයේ සාමාජිකයින් සහ රට වෙනුවෙන් දිවිපිදූ ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ පවුල්වල ඥාතීහු රැසක් ද සහභාගී වූහ.



# ජාතික ආරක්ෂක විද්‍යාලයේ නෙවන කණ්ඩායමේ උපාධි ප්‍රදානෝත්සවය



ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නෙවන සිසුන් කණ්ඩායම සඳහා වූ උපාධි සහතික ප්‍රදානෝත්සවය කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය උපාධි අධ්‍යයනපීඨ ශ්‍රවණාගාරයේ දී ඉකුත් නොවැම්බර් මස 18 වන දින පැවැත්විණ. ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ආරාධනයෙන් මෙම අවස්ථාවට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී (තෙවරක්) ආර්එස්පී (දෙවරක්) යූඑස්පී එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය) එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන) එස්එන්ඩීයූ (චීනය) පීඑස්සී ප්‍රධාන ආරාධිතයා ලෙස එක්විය.




තවද, මෙම අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ ත්‍රිවිධ හමුදාධිපතිවරු, පොලිස්පති ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් ද සහභාගී වූහ. එහිදී, යුද්ධ හමුදාවෙන් 16 දෙනෙක්, නාවික හමුදාවෙන් 08 දෙනෙක්, ගුවන් හමුදාවෙන් 06 දෙනෙක්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරු 03 දෙනෙක් සහ විදේශීය සිසුන් 08 දෙනෙක් (ඉන්දියාව, බංග්ලාදේශය, ඕමානය යන රටවල්වලින් නිලධාරියකු බැගින් සහ සෞදි අරාබියෙන් නිලධාරීන් 5 දෙනෙක්) ඇතුළුව ශිෂ්‍ය නිලධාරීන් 41 දෙනෙක් ජාතික ආරක්ෂාව සහ උපායමාර්ගික අධ්‍යයන පිළිබඳ ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමෙන් පසු ප්‍රධාන ආරාධිත අමුත්තාගේ සුරතින් "එන්ඩීසී" උපාධිය හිමිකරගත්හ.




# ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය තුමන් රාජකාරි අරඹයි



මේජර් ජෙනරාල් කේපීජ් ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ආරක්‍ෂ නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස ඉකුත් නොවැම්බර් මස 25 වන දින කොළඹ - 07, ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන කාර්යාලයේ දී සිය ධුරයේ රාජකාරී භාරගනු ලැබීය. මෙම අවස්ථාවට ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ද සහභාගී විය. තවද, මහජන ආරක්‍ෂක හා පර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍ය තුමන්, ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම්, මහජන ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම්, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානි, ත්‍රිවිධ හමුදාධිපතිවරු, වැඩබලන පොලිස්පති ඇතුළු පිරිසක් ද ඊට එක්වූහ.

# Army Logistic Core Value ග්‍රන්ථය එළිදැක්වේ



යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානය වෙතින් එළිදැක්වූ *"Army Logistic CoreValue"* ග්‍රන්ථයේ මංගල පිටපත යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත ඉකුත් නොවැම්බර් මස 25 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී පිළිගැන්විණ. යුද්ධ හමුදාවේ හටකාර්ය සම්පාදක කටයුතු සහ ප්‍රමිතිකරණය නිසියාකාරව සිදුකිරීම සඳහා මගපෙන්වීමක් ලබාදීමේ අරමුණින් යුද්ධ හමුදා මූලස්ථානයේ පර්යේෂණ සංකල්ප සහ මූලධර්ම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය මත හමුදා කේත අංක 0409A1 යටතේ මෙම ග්‍රන්ථය නිර්මාණය කර ඇත.

යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන සහ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී, යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒඩීසී යුද්ධ හමුදාධිපති වෙත මෙම ග්‍රන්ථය පිළිගැන්වීමේ අවස්ථාවට එක්වූහ.



# ගංවතුරින් විපතට පත් ප්‍රදේශවල නිරීක්ෂණ සංචාරයක


නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය මේජර් ජෙනරාල් කේපීඒ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සමඟින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් නොවැම්බර් මස 28 වන දින අම්පාර හා මන්නාරම් දිස්ත්‍රික්කයේ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් විපතට පත් ප්‍රදේශවල සංචාරයක නිරත වූහ.

මෙම සංචාරයේ දී සහනාධාර ලබාදීමේ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවති සම්මන්ත්‍රණයට ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය එච් වසන්ත පියතිස්ස මැතිතුමන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, යුද්ධ හමුදාධිපති, නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති, නැගෙනහිර නාවික විධානයේ ආඥාපති, 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ අම්පාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ. එසේම, මන්නාරම් දිස්ත්‍රික්කයේ ද ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් එවැනිම සාකච්ඡාවක් පැවති අතර, ඊට නාවික හමුදාධිපති, වන්නි ආරක්ෂක සේනා ආඥාපති, 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, යාපනය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, උතුරු මැද නාවික විධානයේ ආඥාපති ඇතුළු පිරිසක් සහභාගී වූහ.





ජනතාව මුදවාගැනීමේ මෙහෙයුම් සඳහා ආරක්ෂක හමුදා සාමාජිකයන් යෙදවීම, අවතැන් වූ සිවිල් වැසියන්ගේ දේපලවල ආරක්ෂාව තහවුරු කිරීම සහ අවතැන් වූ සියලුම සිවිල් වැසියන් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම වැනි තීරණාත්මක කරුණු පිළිබඳව එහිදී සාකච්ඡා කෙරිණි. ආපදා තත්ත්වය කළමනාකරණය කිරීමේ දී යුද්ධ හමුදා සාමාජිකයින් දක්වනු ලැබූ කැපවීම ද මෙම අවස්ථාවේ දී රාජ්‍ය නිලධාරීන්ගේ ඇගයීමට ලක්විය. මෙම සාකච්ඡාවෙන් අනතුරුව, නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය සහ යුද්ධ හමුදාධිපති ගංවතුරින් අවතැන් වූවන් වෙනුවෙන් ස්ථාපිත කර ඇති රැඳවුම් මධ්‍යස්ථානයන්හි නිරීක්ෂණ සංචාරයක ද නිරත වූහ. එහිදී, අවතැන් වූ වැසියන් සිටින එම මධ්‍යස්ථානවල තත්ත්වය සොයාබලා එම වැසියන්ට ප්‍රමාණවත් පහසුකම් ලබාදීම පිළිබඳව ද ප්‍රාදේශීය නිලධාරීන් සමඟින් සාකච්ඡා කරනු ලැබීය. මෙම සංචාරය අතරතුරදී, නොවැම්බර් මස 26 වන දින කරෙයිතිව් ප්‍රදේශයේ දී පාසල් සිසුන් රැගත් ට්‍රැක්ටරයක් ගංවතුරට හසු වී සිදුවූ අනතුරකින් ජීවිතක්ෂයට පත් වූ සිසුන්ගේ අවමංගල්‍ය උත්සවයට ද යුද්ධ හමුදාධිපති සහභාගී විය.





# විගණන කටයුතු පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළුවක්



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ මඟපෙන්වීම මත මූල්‍ය විනය සහ විනිවිදභාවය පවත්වාගෙන යාම සඳහා වන කැපවීම පිළිබඳ දැනුම්වත් කිරීම හා යුද්ධ හමුදාවේ මූල්‍ය හා පරිපාලන කටයුතුවලට අදාළ නිවැරදි විගණන ක්‍රියා පටිපාටි පිළිබඳ විශේෂඥ අවබෝධයක් ලබාදීමේ අරමුණින් සංවිධානය කෙරුණු වැඩමුළුවක් ඉකුත් නොවැම්බර් මස 06 වන දින යුද හමුදා මූලස්ථානයේදී පැවැත්විණි.


කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙහෙයවනු ලැබූ මෙම වැඩමුළුව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අයවැය සැලසුම්කරණය, ප්‍රසම්පාදනය සහ මූල්‍ය අධීක්ෂණ කටයුතු සඳහා සෘජුව සම්බන්ධ වන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් සහ අධ්‍යක්ෂවරු සහභාගී වූහ. තවද මෙම වැඩමුළුව සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ඒටී කුරුම්බලපිටිය මහතා, අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් ජීපී චම්පිකා මෙනවිය, අධ්‍යක්ෂ ජේපී සුනිල් මහතා, අධ්‍යක්ෂ බීජී තිසර මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ යූපී විජයහේවා මෙනවියද සහභාගී වී සිය විශේෂඥ දැනුම ලබාදුන්හ. යුද්ධ හමුදාව තුළ මූල්‍ය හා ප්‍රසම්පාදන කළමනාකරණය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගැනීම සඳහා වන මූල්‍යමය රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අනෙකුත් පාලන චක්‍රලේඛවලට අනුකූල වීම පිළිබඳව ද මෙමගින් දැනුම්වත් කෙරිණි. විනිවිදභාවය ශක්තිමත් කිරීම සහ අනාගතයේදී ගැටලු මතුවීම වැළැක්වීම සඳහා වන පියවර සහ නිර්දේශ පිළිබඳව ද ඔවුහු වැඩිදුරටත් සාකච්ඡා කළහ.

## ඊශ්‍රායල් ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ හා නවදිල්ලියේ ඊශ්‍රායල් ආරක්ෂක උපදේශක ලෙස කටයුතු කරන කර්නල් අවිහායි සෆ්‍රානි (Avihay Zafrany) ඉකුත් නොවැම්බර් මස 5 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු හමුවිය. එහිදී, ඊශ්‍රායලය සහ ශ්‍රී ලංකාව අතර පවතින දිගුකාලීන සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය අවබෝධය පිළිබඳ අදහස් හුවමාරු කරගත් මොවුන් දෙපළ විශේෂයෙන්ම හමුදා සහයෝගීතාව සහ තාක්ෂණික විශේෂඥ දැනුම හුවමාරු කරගැනීමේ හැකියාව පිළිබඳව ද වැඩිදුරටත් සාකච්ඡා කරනු ලැබූහ.







# අභිමන්ව විසිරගිය දරුවන්ට බුහුමන්

අධ්‍යාපන අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශිෂ්‍යභට බලකායට අයත් පාසල් ශිෂ්‍යභටයින්ගේ "හර්මන් ලූස් සහ ද සොයිසා අභියෝග කුසලාන - 2024" හි විසිර යාමේ පෙළපාලිය ඉකුත් නොවැම්බර් මස 10 වන දින රන්ටැඹේ ජාතික ශිෂ්‍යභට පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඑස් ෆොන්සේකා යූඑස්පී පීඑස්සී ගේ ගෞරවනීය ආරාධනයෙන් මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

"හර්මන් ලූස් ශුරතා කුසලානය" වාර්ෂිකව පිරිමි පාසලක් තුළින් දක්ෂතම ශිෂ්‍යභට කණ්ඩායමට පිරිනමනු ලබන අතර, ද සොයිසා ශුරතාව බාලිකා පාසලකින් දක්ෂතම ශිෂ්‍යභට කණ්ඩායම වෙනුවෙන් පිරිනමනු ලැබේ. ඒ අනුව දීප ව්‍යාප්ත කණ්ඩායම් 4485 ක් අතුරින් ශිෂ්‍යභට කණ්ඩායම් 60ක් මෙම අවසන් තරගයට සහභාගී වූ අතර, එහිදී කොළඹ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍යභට බණ්ඩ බාලක අංශයේ ප්‍රථම ස්ථානය දිනාගනිමින් 2024 වර්ෂය







සඳහා දිවයිනේ හොඳම බණ්ඩය සඳහා වන හර්මන් ලූස් කුසලානය හිමිකර ගත්තේය. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය සහ ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය පිළිවෙලින් එහි දෙවන සහ තෙවන ස්ථාන හිමිකර ගන්නා ලදී. මේ අතර කාන්තා අංශයේ දක්ෂතම බණ්ඩය සඳහා වන "ද සොයිසා" සම්මානය කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලය දිනාගත් අතර, මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය සහ කොළඹ දේවි බාලිකා විද්‍යාලයට පිළිවෙලින් දෙවන සහ තෙවන ස්ථාන හිමිවිය.

පදක්කම් සහ සහතිකපත් ප්‍රදානය කිරීමෙන් අනතුරුව, ශිෂ්‍යභට පෙළපාලිය ආමන්ත්‍රණය කළ යුද්ධ හමුදාධිපති විනයානුකූලව අභියෝගවලට මුහුණ දීමට පුහුණු වූ තරුණ සමාජයක් ගොඩනැගීම සඳහා ජාතික ශිෂ්‍යභට බළකාය විසින් සිදුකරනු ලබන කාර්ය පිළිබඳව සිය ප්‍රශංසාව පළකළේය. තවද, එතුමන් තම මතකයන් සිහිපත් කරමින් මීට වසර 40 කට පෙර පාසල් ශිෂ්‍යභටයකු ලෙස ජාතික ශිෂ්‍යභට බළකායෙන් පුහුණුව ලැබූ බවත් එසේම අද දින විසිර යාමේ පෙළපාලියේ ප්‍රධාන ආරාධිතයා ලෙස තමාට ආරාධනා කිරීම පිළිබඳව ජාතික ශිෂ්‍යභට බළකායට ස්තුතිවන්ත වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළේය.





# මහනුවර යුද්ධ හමුදා මූලික රෝහලේ සංචාරයක







මහනුවර පිහිටි යුද්ධ හමුදා මූලික රෝහලේ ක්‍රියාකාරීත්වය සහ එහි වත්මන් තත්ත්වය පිළිබඳ සොයාබැලීම සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් නොවැම්බර් මස 09 වන දින සංචාරයක නිරත විය. එහිදී, එම රෝහලේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව්එම්එච්එස් වීරසූරිය විසින් යුද්ධ හමුදාධිපති උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව රෝහලේ සේවාවන් සහ පහසුකම් පිළිබඳව එතුමන්ව දැනුම්වත් කිරීමට ද කටයුතු කරන ලදී. එහිදී, යුද්ධ හමුදාධිපති රෝහලේ ප්‍රසස්ත හැකියාවන් නිරීක්ෂණය කරමින් එහි කාර්යන් නිසි අයුරින් සිදුකිරීමට උපදෙස් ද ලබා දුන්නේය.

මේ වනවිට මහනුවර යුද්ධ හමුදා රෝහල ඇඳන් 122 කින් යුක්ත වන අතර, බාහිර රෝගී අංශය, ආබාධ සහිත පුද්ගලයින් සඳහා කෘත්‍රිම හා විකලාංග සේවා, විවිධ රෝග සඳහා සායනික සේවා, දන්ත ප්‍රතිකාර, නවීන වෛද්‍ය උපකරණ සහිත අංගසම්පූර්ණ ශල්‍යාගාර සහ ඖෂධ පහසුකම ඇතුළු සේවා පහසුකම් රැසකින් ද සමන්විතය.



# ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා රෙජිමේන්තුව නව සෙවණකට





2030 වර්ෂය වන විට දක්‍ෂ සහ තාක්‍ෂණිකව දියුණු හමුදාවක් බවට පත්කිරීමේ පියවරක් ලෙස යුද්ධ හමුදාව ප්‍රතිව්‍යුහගත කිරීම මේ වනවිට අරඹා ඇත. ඒ අනුව එහි අදියරක් ලෙස එතෙක් කොළඹ මැලේවීදියේ ස්ථාපිතව තිබූ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තු මධ්‍යස්ථානය කොස්ගම, සාලාව ප්‍රදේශයේ නවතමයෙන් ස්ථාපනය කොට ඉකුත් නොවැම්බර් මස 11 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ අතින් විවෘත කෙරිණ.

යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන සහ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති විසින් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සමරු ඵලකය නිරාවරණය කරන ලදී. ඉන් අනතුරුව, එහි ස්ථාපිත 1 සංඥා බලසේනා මූලස්ථානයේ සංචාරයක ද නිරත වූ හෙතෙම හමුපිරිස් ආමන්ත්‍රණය කරමින් යුද්ධ හමුදාවේ සමස්ත මෙහෙවර සඳහා ඔවුන්ගේ දායකත්වයේ වැදගත්කම පිළිබඳව අවධාරණය කළේය. අනතුරුව, යුද්ධ හමුදාවේ ඉදිරි උපායමාර්ගික සැලසුමට අනුව ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක, 1 සංඥා බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති, 11 සහ 12 බළඇණිය ශ්‍රී ලංකා සංඥා බලකායන්හි අණදෙන නිලධාරීන් වෙත "කඳවුරු භූමි හිමකම් සන්නස් පත්‍රය" පිරිනැමීම ද එහිදී යුද්ධ හමුදාධිපතිගේ සුරතින් සිදුකෙරිණ.





# යුද්ධ හමුදා හොකී කණ්ඩායමට පැසසුම්

පසුගිය දා පැවති "*Next Gen' Premier League* ශූරතාවලිය - 2024" ජයග්‍රහණය කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා හොකී කණ්ඩායමේ සාමාජිකයෝ ඉකුත් නොවැම්බර් මස 12 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ. යුද්ධ හමුදාවට අභිමානයක් එක්කරමින් කොළඹ කෘත්‍රිම හොකී පිටියේ දී පසුගිය නොවැම්බර් මස 09 වන දින පැවති මෙම තරගාවලියේ දී එම ක්‍රීඩකයින් දැක්වූ විශිෂ්ට දක්ෂතා වෙනුවෙන් යුද්ධ හමුදාධිපති එහිදී, සිය සුභාශිංසන පුදකරමින් ඔවුන් සමග අදහස් හුවමාරු කරගත්හ. තවද, යුද්ධ හමුදාධිපති විසින් එම ක්‍රීඩකයින් වෙත අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා මූල්‍ය දිරිගැන්වීමක් ද සිදුකරන ලදී. මෙම අවස්ථාවට හොකී කණ්ඩායමේ සභාපති මේජර් ජෙනරාල් නලින් බණ්ඩාරනායක යූඑස්පී, යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එල්කේටී ප්‍රනාන්දු ආර්එස්පී යූඑස්පී, කණ්ඩායම් කළමනාකරු සහ කණ්ඩායම් පුහුණුකරු එම්ජීඑම් රිෆාස් ද සහභාගී වූහ.



## පොපි මල් දිනය සමරා



ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමයේ සාමාජිකයින් ඉකුත් නොවැම්බර් මස 07 වන දින පෙරවරුවේ යුද්ධ හමුදාධිපති කාර්යාලයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමු වූහ. එහිදී, දිවිපිදූ සියලුම රණවිරුවන් අනුස්මරණය කරනු වස් ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමයේ සභාපති ලුතිනන් කර්නල් අජිත් සියබලාපිටිය (විශ්‍රාමික) ගේ සුරතින් යුද්ධ හමුදාධිපති වෙත පොපි මලක් පැළඳවිය. පොපි මල් අරමුදල වෙනුවෙන් යුද්ධ හමුදාධිපති විසින් මූල්‍ය පරිත්‍යාගයක් ද එම අවස්ථාවේ සිදුකරන ලද අතර, එම සංගමයේ සාමාජිකයන් යුද්ධ හමුදාධිපති වෙත ඔවුන් විසින් නිර්මාණය කරන ලද මෙවර සේවාමුක්ත සඟරාවේ පිටපතක් පිරිනැමීම ද එහිදී සිදුවිය.

සියලුම විශ්‍රාමික රණවිරුවන් වෙනුවෙන් මේ වනවිට ක්‍රියාත්මක වන සුභසාධන ව්‍යාපෘතීන් පිළිබඳව අවධානය යොමුකරමින් එම සංගමයේ නියෝජිතයින් සමග යුද්ධ හමුදාධිපති සුහද පිළිසඳරක ද නිරත වූහ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමයේ ලේකම් කර්නල් සුජිත් ජයසේකර සහ පොපි කමිටුවේ සාමාජිකයින් කිහිපදෙනකු ද සහභාගී වූහ.

# බංග්ලාදේශ මහ කොමසාරිස් හමුවී





ශ්‍රී ලංකාවේ බංග්ලාදේශ මහ කොමසාරිස්, ආන්දාලිබ් එලියස් මහතා (Andalib Elias), ඉකුත් නොවැම්බර් මස 20 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය. යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවති මෙම සුහද හමුවේදී, ද්විපාර්ශ්වීය වශයෙන් වැදගත් වන කරුණු රැසක් පිළිබඳව සාකච්ඡා කරනු ලැබිය. තවද, රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල කොටසක් ලෙස දෙරටෙහි යුද්ධ හමුදාවන් අතර සහයෝගය පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳවද එහිදී සාකච්ඡා කෙරුණු අතර, මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවේ බංග්ලාදේශ ආරක්ෂක උපදේශක කොමදෝරු එම්. මොනිරුස(ර්)මන් (M. Moniruzzaman) ද සහභාගී විය.

# අභිමන් ගමනකට උණුසුම් සුබ පැතුම්



මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් වෙත එම අධිකාරියේ සංකේත පිරිනැමීම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් ඉකුත් නොවැම්බර් මස 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ.

මෙම අවස්ථාවට එක්වූ උසස්වීම් ලැබූ නිලධාරීන් වූයේ ශ්‍රී ලංකා පාබල හමුදාවේ මේජර් ජෙනරාල් කේඑන්ඩී කරුණාපාල ආර්එස්පී එන්ඩීයූ, ශ්‍රී ලංකා සංඥා බලකායේ මේජර් ජෙනරාල් ජීඑස් ෆොන්සේකා යූඑස්පී පීඑස්සී, ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ මේජර් ජෙනරාල් එස්පීජී ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, ගැමුණු හේවා බලකායේ මේජර් ජෙනරාල් එච්සීඑල් ගලප්පත්ති ආර්එස්පී යූඑස්පී, ශ්‍රී ලංකා පාබල හමුදාවේ මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ මේජර් ජෙනරාල් එම්පීඑන්ඒ මුතුමාල යූඑස්පී පීඑස්සී, විජයබාහු පාබල රෙජිමේන්තුවේ මේජර් ජෙනරාල් කේඩීඑම්එල් සමරදිවාකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහ ගැමුණු හේවා බලකායේ මේජර් ජෙනරාල් කේජේඑන්එම්පීකේ නවරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ යන නිලධාරීන්ය. දශක තුනකට අධික කාලයක් රට වෙනුවෙන් සිදුකළ සේවය වෙනුවෙන් එම උසස්වීම් ලැබූ නව මේජර් ජෙනරාල්වරු වෙත යුද්ධ හමුදාධිපති විසින් එහිදී සිය කෘතවේදීත්වය සහ සුබ පැතුම් පිරිනමන ලදී.

# එක්සත් ජනපද ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පිරිසක් සංචාරයක



ආරක්ෂක අමාත්‍යාංශය සහ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සහයෝගය මත ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඉකුත් නොවැම්බර් මස 07 වන දින එක්සත් ජනපද ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පාඨමාලා හදාරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සමගින් කථිකාවතක් පැවැත්වූහ. ද්විපාර්ශ්වික හමුදා සහයෝගීතාව සහ උපායමාර්ගික ආරක්ෂාව පිළිබඳ අන්‍යෝන්‍යය අවබෝධය වැඩිදියුණු කිරීම එහි අරමුණ විය. බහුජාතික හමුදා ක්‍රියාන්විතයන් සඳහා නායකත්ව භූමිකාවන් සැපයීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සූදානම් කිරීම සඳහා එක්සත් ජනපද ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලාවේ එක් කොටසක් වශයෙන් එම නියෝජිත පිරිස සිය සංචාරය සිදුකරනු ලැබූහ. ඉන්දියන් සාගරයේ සහ ඉන්දු පැසිෆික් කලාපයේ ශ්‍රී ලංකාවේ උපායමාර්ගික ස්ථානගත කිරීම් පිළිබඳව මෙහිදී ප්‍රධාන වශයෙන් සාකච්ඡා කෙරිණි.
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ විසින් එහිදී, යුද්ධ හමුදාවේ උපායමාර්ගික අරමුණු සහ ක්‍රියාන්විත අභියෝග පිළිබඳව අදහස් දැක්විය.

එම හමුවේදී ශ්‍රී ලංකා නාවික හමුදා මාණ්ඩලික ප්‍රධාන රියර් අද්මිරාල් බීඒකේඑස්පී බනාගොඩ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් නීතිවිරෝධී සමුද්‍ර ක්‍රියාකාරකම්වලට එරෙහිව කටයුතු කිරීම සහ තීරණාත්මක මුහුදු මාර්ග ආරක්ෂා කිරීම ඇතුළු සමුද්‍රීය ආරක්ෂක ප්‍රමුඛතා පිළිබඳවත් සිය අදහස් දැක්විය. එමෙන්ම, ශ්‍රී ලංකා ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධාන එයාර් වයිස් මාර්ෂල් ආර්එස් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී (දෙවරක්) යූඑස්පී (දෙවරක්) විසින් ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ කටයුතු වෙනුවෙන් ගුවන් හමුදාවේ කාර්යභාරය පිළිබඳවද, ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ කාර්ය නියුතු අධ්‍යක්ෂ ජෙනරාල් සහ වැඩබලන අධ්‍යක්ෂ (පර්යේෂණ) කර්නල් එම්බීබීඑන් හේරත් ආර්එස්පී විසින් ඉන්දියානු සාගරය සහ ඉන්දු පැසිෆික් කලාපයේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක භූමිකාව පිළිබඳව ද විශ්ලේෂණාත්මක ඉදිරි දර්ශනයක් ලබාදුන්හ. මෙම අවස්ථාවට එක්සත් ජනපදයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ආරක්ෂක උපදේශකයින්, එක්සත් ජනපද ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නියෝජිතයින්, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක සහ ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ද සහභාගී වූහ.

# චීන ආරක්ෂක උපදේශකයින් සමඟ හමුවක්



ශ්‍රී ලංකාවේ මහජන චීන සමූහාණ්ඩුවේ තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක ජ්‍යෙෂ්ඨ කර්නල් ෂෝ බෝ, නියෝජ්‍ය ආරක්ෂක උපදේශක කර්නල් ගාඕ බින් යන නියෝජිතයින් යුද්ධ හමුදා මූලස්ථානයේ දී ඉකුත් නොවැම්බර් මස 01 වන දින යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ හමුවූහ. මෙම සාකච්ඡාවේ දී දෙරටෙහි සන්නද්ධ හමුදා අතර පවතින දිගුකාලීන සුහදතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය පිළිබඳ අදහස් හුවමාරු කර ගැනිණ.

# නිවාස සිහිනය සැබෑ කරදී




මහනුවර ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා ඇති පවුලක් සඳහා අභිනවයෙන් ඉදිකරන ලද නිවසක් එම හිමිකරුවන් වෙත භාරදීම ඉකුත් නොවැම්බර් මස 09 දින යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ගේ සුරතින් සිදුකෙරිණ. 75 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව ඉදිකළ මෙම නිවස වෙනුවෙන් 6 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඊජේබීයූපී එගොඩගෙදර යූඑස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ එම ඒකකයේ භටපිරිස් ශ්‍රමදායකත්වය සැපයූහ. මෙම ව්‍යාපෘතියට ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සියලු ඒකකවල ත්‍යාගශීලීන් විසින් මූල්‍ය දායකත්වය ලබාදෙන ලදී.

## යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන සුබ මොහොතින් රාජකාරි අරඹයි




ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 44 වන නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ලෙස ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ඉකුත් නොවැම්බර් මස 28 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී රාජකාරි භාරගනු ලැබීය. ඉන්දියාවේ ඩෙහ්රාඩන් *(Dehradun)* හි හමුදා විද්‍යාපීඨය තුළින් මූලික හමුදා පුහුණුව හදාර ඇති එතුමන් වර්ෂ 1990 ඔක්තෝම්බර් මස 05 වන දින අධිකාරියට පත්ව 7 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට අනුයුක්ත කෙරිණි. රෙජිමේන්තුව තුළ ප්‍රධාන ධූරයන් රැසක් හොබවා ඇති හෙතෙම 18 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී මෙන්ම 661 හා 663 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපති ධූරය ද හොබවා ඇත.

එමෙන්ම, විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ නිලධාරී අධ්‍යයන මධ්‍යස්ථානයේ ප්‍රධාන උපදේශක, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ උපදේශක සහ පුහුණු කණ්ඩායම් ප්‍රධාන, 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක වැනි අණ හා මාණ්ඩලික ධූරයන් රැසක් හොබවා ඇති ඔහු මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති ලෙසද කටයුතු කර ඇත. නව නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන එම ධූරයේ රාජකාරි භාර ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ලෙස ද කටයුතු කරනු ලැබීය. අභිනවයෙන් පත් වූ යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන වෙත රණවිරුවා ද මෙසේ සුබ පැතුම් එක්කරයි.

# සුහද හමුවක මතක



යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහ උතුරු පලාත් නව ආණ්ඩුකාර නාගලිංගම් වේතානායගන් අතර සුහද හමුවක් ඉකුත් නොවැම්බර් මස 02 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානයේ දී සිදුවූහ.

එහිදී, එම ආරක්‍ෂක සේනා මූලස්ථානය මගින් සිවිල් ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉටුකරනු ලබන ප්‍රජා සේවාවන් පිළිබඳ ආණ්ඩුකාරවරයා දැනුම්වත් කරන ලද අතර, පලාලි පිහිටි **CIMIC** උද්‍යානය වෙත නිරීක්‍ෂණ චාරිකාවක් සඳහා ද ආණ්ඩුකාරවරයා කැඳවාගෙන යනු ලැබීය.

මෙම අවස්ථාව සඳහා 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ද සහභාගී විය.



# වාර්ෂික කඨින චීවර පූජා පිංකම





ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ විශේෂ කාර්ය බලකා සාමාජිකයින්ගේ සහයෝගය මත කන්කසන්තුරය තිස්ස රාජමහා විහාරයේ වාර්ෂික කඨින චීවර පූජා පිංකම මෙවරත් උත්කර්ෂවත්ව ඉකුත් ඔක්තෝබර් මස 18 සහ 19 යන දෙදින තුළ තිස්ස රාජමහා විහාරස්ථානයේදී පැවැත්විණ. යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහ හකාස අණසක යාපනය ආඥාපති මේජර් ජෙනරාල් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ පැවති මෙම පිංකම සඳහා ප්‍රදේශවාසී විශාල පිරිසක් ද එක්වූහ.

# ඉතිහාස මතක සොයා ආ හිටපු ඉන්දීය සාමසාධක නිලධාරීන්





ඉකුත් නොවැම්බර් මස 16 සහ 17 යන දෙදින තුළ හිටපු ඉන්දීය සාමසාධක හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරී මඬුල්ලක් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් මුලතිව් 59 වන පාබල සේනාංක බලප්‍රදේශය තුළ සංචාරයක නිරත වූහ. වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ සපැමිණි එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර ඉන්දීය යුද්ධ හමුදා පාබල පුහුණු පාසලේ සේනාවිධායක ලුතිනන් ජෙනරාල් ගජේන්ද්‍ර ජෝෂි සහ හිටපු නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි ලුතිනන් ජෙනරාල් සරත් චන්ද් (විශ්‍රාමික) යන නිලධාරීන් ද වූහ. 59 වන පාබල සේනාංක මූලස්ථාන නිලධාරී නිවස්නයෙහි විචිත්‍රවත් සන්ධ්‍යාවක දී ඔවුන් වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් ද පැවැත්විණි. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සාමය, සහෝදරත්වය හා ඓතිහාසික උරුමය තවත් ශක්තිමත් කරමින් පැමිණි එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට එම සංචාරය මහත් අභිමානයක් ගෙනදුන් අවස්ථාවක් විය.

# සංචාරයක මතක සටහන්







වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පසුගියදා සිය බලප්‍රදේශයට අයත් පාබල සේනාංකවල සංචාරයක නිරතවිය. ඒ අනුව ඉකුත් නොවැම්බර් 16 වන දින 59 වන පාබල සේනාංකයේ සංචාරය කරමින් 5 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 6 බලඇණිය ගැමුණු හේවා බලකාය, 6 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව, 12 බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව සහ 10 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ඔහු සිය නිරීක්ෂණයට බඳුන් කළේය. එසේම 21 වන පාබල සේනාංකයට අයත් 2 යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව සහ 2(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ ද හෙතෙම සංචාරය කළේය.

එම ඒකකයන්හි රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ක්‍රියාන්විත සූදානම, සාමූහික එකමුතුව හා චිත්ත ධෛර්යය ඉහළ නැංවීමේ අරමුණින් සිදුකළ මෙම සංචාරයන් හිදී හෙතෙම එහි හටපිරිස් සමග සුහද පිළිසඳරක ද නිරත වූහ. මෙම අවස්ථාවන්ට 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී, 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, එම සේනාංකවලට අයත් බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීවරු ඇතුළු පිරිසක් සහභාගී වූහ.



# ජල පිරිපහදු යන්ත්‍රයක් පරිත්‍යාග කෙරේ





කෝරළේපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුඩිම්බිමලේ (තොප්පිගල) ග්‍රාම නිලධාරී වසමේ පවුල් 130 කගේ හා මඩකලපුව, කල්කුඩා, කුඩිම්බිමලේ කුමාරන් විද්‍යාලයේ සිසු සිසුවියන්ගේ ප්‍රයෝජනය සඳහා ජල පිරිපහදු යන්ත්‍රයක් එම පාසල් පරිශ්‍රය තුළ සවිකරදීමට ඉකුත් නොවැම්බර් මස 03 වන දින කටයුතු කෙරිණ. 232 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්පීඑස් ප්‍රසාද් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ 12 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරී මේජර් එච්එම්ව්පී හේරත් ශ්‍රීලංජාආබමු ගේ මූලිකත්වයෙන් එම ඒකක භටපිරිස් ඊට පූර්ණ ශ්‍රම දායකත්වය සැපයූහ.

මේ සඳහා අංක 38 කැන්දලන්ද, වැල්මිල්ලෙ, බණ්ඩාරගම ලිපිනයෙහි පදිංචි තිළිණි රාමනායක මහත්මිය ඇතුළු පවුලේ සාමාජිකයන් සම්පත් දායකත්වය දැක්වූ අතර රුපියල් මිලියනයකට ආසන්න මුදලක් ඊට වැය කෙරිණ. 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පී කාරියවසම් ගේ ප්‍රධානත්වයෙන් සිදුවූ මෙම සත්කාරය සඳහා නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරී කර්නල් එම්ජීජීඩබ්ලිව්ආර් ගමගේ, කෝරළේපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කේ. සිත්තිරවෙල් මහතා, කල්කුඩා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ මෙන්ම ගම්වාසීන් විශාල පිරිසක් සහභාගී වූහ.

# රණවිරු සම්පත් කේන්ද්‍රයෙන් ප්‍රජා සත්කාර රැසක්





පසුගිය 75 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව රණවිරු සම්පත් කේන්ද්‍රය මගින් වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී. ඒ යටතේ හැඳල වත්තල පිහිටි ලාදුරු රෝහලේ නේවාසික රෝගීන් හට දිවා ආහාර වේලක් ලබාදීම හා වියලි සලාක මලු බෙදාදීමේ ප්‍රජාසත්කාරයක් ඉකුත් ඔක්තෝබර් මස 10 වන දින සිදුකෙරිණ. එසේම, එම රෝහල් පරිශ්‍රය පිරිසිදු කිරීමද භට පිරිස් අතින් සිදුකෙරිණ. තවද, රණවිරු සම්පත් කේන්ද්‍රයේ බලලත් නිලධාරී හා සැරයන් නිවස්නයේ අභිනවයෙන් ඉදිකළ නේවාසිකාගාරය විවෘත කිරීම ද එහිදී සිදුකෙරුණු අතර, එම අවස්ථාවට රණවිරු සම්පත් කේන්ද්‍රයේ සේනාවිධායක බ්‍රිගේඩියර් පීඑන් සිරිවර්ධන ආර්එස්පී යූඑස්පී ඇතුලු එම කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සාමූහිකව එකතු වූහ.





# අභිමානවත් 12 වන සංවත්සරය සමරමින්

ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) සිය 12 වන සංවත්සරය ඉකුත් නොවැම්බර් මස 18 සහ 19 යන දෙදින තුළ පනාගොඩ පිහිටි ආරක්‍ෂක සේනා මූලස්ථානයේදී එහි ආඥාපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සමරනු ලැබීය.

එහිදී, මාතෘ භූමිය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ යුද්ධ හමුදා සාමාජිකයින් වෙත පිං පැමිණවීම සහ ආරක්‍ෂක සේනා මූලස්ථානයේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට ආශිර්වාද පතා පනාගොඩ බෝධිරාජාරාම විහාරස්ථානයේදී පැවති බෝධිපූජා වැඩසටහන ප්‍රධාන විය.

තවද, නොවැම්බර් මස 19 වන දින 1 කාරක රෙජිමේන්තුව ඉංජිනේරු බලකායේ භටපිරිස් විසින් ආඥාපති තුමන් වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය පුදකරනු ලැබූ අතර, අනතුරුව, ආරක්‍ෂක සේනා ආඥාපති විසින් එම මූලස්ථානයේ සිවිල් කාර්ය මණ්ඩලය වෙත වියළි සලාකා ඇසුරුම් පරිත්‍යාග කිරීමේ විශේෂ සුබසාධන වැඩසටහනක් ද දියත් කරන ලදී. අනතුරුව පැවති තේ පැන් සංග්‍රහයද යුද්ධ හමුදා සාමාජිකයින් සහ සිවිල් කාර්ය මණ්ඩලය සමගින් පැවති සියලු නිල දිවා භෝජන සංග්‍රහය ද සංවත්සර වැඩසටහන් අතර කැපී පෙනුණි. එහිදී, ආඥාපති භටපිරිස් ආමන්ත්‍රණය කිරීමටද කටයුතු කළ අතර, ආරක්‍ෂක සේනා මූලස්ථානයේ පොදු අරමුණු සාර්ථක කරගැනීම සඳහා කාර්ය මණ්ඩලය දක්වන දායකත්වය ඔහුගේ ඇගයුමට ලක්විය.

මෙම අවස්ථාවට 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී, 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 61 වන පාබල සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එල්එස් දයාවංශ, අණදෙන නිලධාරීන්, මාණ්ඩලික නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් කාර්ය මණ්ඩලය සහභාගී වූහ.







# ප්‍රශ්නෝත්තර පොත් කට්ටල පරිත්‍යාගයක්







යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සහ සිවිල් සේවක මහත්වරුන්ගේ පාසල් අධ්‍යාපනය ලබන දරු දැරියන් වෙත ප්‍රශ්නෝත්තර පොත් කට්ටල සහ අභ්‍යාස පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 25 වන දින මධ්‍යම ආරක්‍ෂක සේනා මූලස්ථානයේදී පැවැත්විණ. එහි ආඥාපති මේජර් ජෙනරාල් වයිඑම්බී යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ මගපෙන්වීම මත දියත්කළ මෙම වැඩසටහනේදී 2 සිට 5 ශ්‍රේණි සඳහා ප්‍රශ්නෝත්තර පොත් කට්ටල 160 ක් සහ අභ්‍යාස පොත් පාර්සල් පරිත්‍යාග කෙරිණ.

# ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවයක්







මහනුවර, කුළුගම්මන ප්‍රේමරත්න මහා විද්‍යාලයේ ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවය ඉකුත් නොවැම්බර් මස 18 වන දින පැවැත්විණ. එහි විදුහල්පති තුමන්ගේ ඉල්ලීමකට අනුව එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒයූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී සහභාගී විය. එහිදී, එතුමන් විසින් ශක්තිමත් නායකත්වය, විනය හා වගකීම් තුළින් ඵලදායී නායකයින් බිහිවීම පිළිබඳ දරුවන් දැනුම්වත් කිරීමේ හරවත් දේශනයක්ද සිදුකරන ලදී. මෙම අවස්ථාවට එම විද්‍යාලයීය ගුරු භවතුන් සහ දෙමව්පියෝ රැසක් ද එක්වූහ.

# "මනෝවිද්‍යාත්මක වැඩමුළුව" සාර්ථකව අවසන්





යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් මෙම වසරේ නෙවන අදියර යටතේ සංවිධානය කළ මනෝවිද්‍යාත්මක වැඩමුළුවක් පසුගිය නොවැම්බර් මස 25 දින සිට නොවැම්බර් මස 29 වන දින දක්වා පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ඒ සඳහා යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් නිලධාරීහු 54 දෙනෙක් සහභාගී වූහ.











මෙම වැඩමුළුවේදී, මනෝවිද්‍යාව අර්ථකතනය කිරීම, ඉලක්කගත ප්‍රේක්ෂක විශ්ලේෂණය, මනෝවිද්‍යා මෙහෙයුම් ඉලක්ක සංවර්ධනය, ප්‍රචාරක විශ්ලේෂණය සහ ප්‍රතිප්‍රචාරණය, මනෝවිද්‍යාත්මක ක්‍රියාකාරකම් කෙරෙහි සංස්කෘතික උපායමාර්ගික බලපෑම, චිත්තවේගී තොරතුරු ඔස්සේ සමාජ මාධ්‍යයට වන බලපෑම සහ එහි හැසිරීම තුළින් මනෝවිද්‍යාත්මක මෙහෙයුම් කෙරෙහි ඇති වන බලපෑම ආදී කරුණු සාකච්ඡා කෙරිණ.

මෙම දේශන එම ක්ෂේත්‍රය සම්බන්ධව පුළුල් දැනුමක් ඇති යුද්ධ හමුදා නිලධාරීන් සහ සිවිල් ක්‍රියාකාරිකයින් විසින් මෙහෙවනු ලැබූහ. මෙම වැඩමුළුවේ සමාප්ති අවස්ථාව යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් කේඒඑන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.







# මුලතිව් කෝකිලායි ශ්‍රී සම්බෝධි විහාරස්ථානයේ කඨින පිංකම

මුලතිව් ශ්‍රී සම්බෝධි විහාරයේ වාර්ෂික කඨින පූජා මහෝත්සවය ඉකුත් නොවැම්බර් මස 09 හා 10 යන දෙදින තුළ පූජ්‍ය තිස්සපුර ගුණරතන හිමියන්ගේ අනුශාසකත්වය යටතේ පැවැත්විණ. 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ 591 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්ජේ උබේසේකර ආර්එස්පී පීඑස්සී ගේ අධීක්ෂණයෙන් සිදුකළ මෙම පුණ්‍යකර්මය සඳහා එම බලසේනාව, 12 ශ්‍රී ලංකා පාබල හමුදාව සහ 10 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු හටපිරිස් ශ්‍රම දායකත්වය සැපයූහ.

මෙම කඨින මහා පිංකම සඳහා බෞද්ධ සැදැහැවතුන් 200 කට ආසන්න පිරිසක් කෝකිලායි, නුගේගොඩ, පිලියන්දල, පාදුක්ක, ගම්පහ, නිට්ටඹුව, වරකාපොළ, පදවි ශ්‍රීපුර සහ ජනකපුර යන ප්‍රදේශ නියෝජනය කරමින් සහභාගී වූහ.

# සංවත්සරය නිමිත්තෙන් ආගමික වතාවත් රැසක්





24 වන පාබල සේනාංකයේ 11 වන සංවත්සරය ඉකුත් නොවැම්බර් මස 27 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ආගමික වතාවත්වලට මුල්තැන ලබාදෙමින් එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්ජ්සී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ආගමික කටයුතු රැසක් සිදුකෙරිණ. එහිදී, ඉකුත් ඔක්තෝම්බර් මස 26 වන දින සේනාංකයේ ඇතුළත විහාරස්ථාන පරිශ්‍රයේ දී යුද්ධ හමුදාවට සහ සියලු හටපිරිස් වෙත ආශිර්වාද කිරීමේ බෝධිපූජා පිංකමක් පැවැත්විණ. තවද, ඉකුත් ඔක්තෝබර් මස 30 වන දින අම්පාර ප්‍රදේශයේ සිට වැඩම කළ භික්ෂූන් වහන්සේලා 11 නමක් උදෙසා සාංඝික දානමය පිංකමක්ද පවත්වා සියළුදෙනා හට ආශිර්වාදය පුදකළේය.

# ආපදා ප්‍රතිචාර පුහුණු වැඩමුළුවක්

නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානය සහ ඒ යටතේ ස්ථාපිත පාබල සේනාංක, පාබල බලසේනා හා ඒකකයන්හි රාජකාරී ඉටුකරනු ලබන සෙසුනිලයින් 131 දෙනකු සහ නිලධාරීන් 07 දෙනකු සඳහා මූලික ආපදා ප්‍රතිචාර පුහුණුව පිළිබඳව දැනුවත් කිරීමේ දින 03 ක වැඩමුළුවක් ඉකුත් ඔක්තෝබර් 28 වන දින සිට ඔක්තෝබර් 30 වන දින දක්වා 22 වන පාබල සේනාංකයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා පුහුණු මධ්‍යස්ථානයේ නිලධාරී/සෙසුනිලයන්ගේ ආපදා ප්‍රතිචාර පුහුණු හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් යුතුව සංවිධානය කෙරුණු මෙම වැඩමුලුවේ උපදේශකත්වය ගම්පල පිහිටි යුද හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානයේ උපදේශකයින් විසින් සිදුකරනු ලැබූහ.



# බලඇණි පුහුණු පාසලේ සංචාරයක





64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් වීඩීඑස් පෙරේරා ඉකුත් නොවැම්බර් මස 24 වන දින 11 ශ්‍රී ලංකා පාබල හමුදාවේ බලඇණි පුහුණුවීම් සිදුකරන මුලංකාවිල් බලඇණි පුහුණු පාසලෙහි නිරීක්ෂණ සංචාරයක නිරතවිය. එහිදී, 11 ශ්‍රී ලංකා පාබල හමුදාවේඅණදෙන නිලධාරී විසින් සේනාංකාධිපති පිළිගනු ලැබූ අතර, සම්ප්‍රදායානුකූලව සම්මාන මුරයක් ද පිරිනමන ලදී. එහිදී, හටපිරිස් ඇමතූ සේනාංකාධිපති 11 ශ්‍රී ලංකා පාබල හමුදාවේ 05 වන අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී ඉටුකළ කාලය පිළිබඳ මතකාවර්ජනයක් සිදුකළ අතර, ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන එම ඒකකයේ ගෞරවය ආරක්ෂා කරමින් පුහුණුවීම් සාර්ථකව නිමකර තම රාජකාරිය විනයගරුකව ඉටුකරන ලෙස අවධාරණය කරන ලදී.

# අභිමානවත් 14 වන සංවත්සරය සමරමින්





143 වන පාබල බලසේනාවේ 14 වන සංවත්සර දිනය ඉකුත් නොවැම්බර් 30 වන දින එම බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඒඩීටීපී විමලසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, බලසේනාධිපති වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය පුදකිරීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය, රුක් රෝපණය සංවත්සර දින වැඩසටහන් අතර ප්‍රධාන තැනක් ගනු ලැබීය.

# රුක් රෝපණ වැඩසටහනක්

යුද්ධ හමුදාවේ 75 වෙනි සංවත්සරයට සමගාමීව සංවිධානය කළ රුක් රෝපණ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 09 වන දින 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පී කාරියවසම් ඇතුළු එම සේනාංක හටපිරිස්වල සහභාගීත්වයෙන් එම මූලස්ථාන පරිශ්‍රයේදී සිදුකෙරිණ. මෙහිදී, කොස්, දෙහි, බෙලි, දිවුල් හා කරඳ ආදී ඉතා වටිනා ශාඛ පැළ 600 ක් පමණ රෝපණය කෙරිණ.







## පරිසරය සුරැකීමේ අරමුණ පෙරදැරිව



10 (සේවා) ගැමුණු හේවා බලඇණියේ අණදෙන නිලධාරී ගේ සහභාගීත්වයෙන් එම ඒකක සාමාජිකයින් එකතුව සිරිනාරකුලම් හංදියේ සිට තිරිකේදීස්වරම් හංදිය දක්වා මාර්ගය දෙපස පැල රෝපණය කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 09 වන දින සිදුකරනු ලැබූහ. 541 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ගේ උපදෙස් පරිදි සිදුකළ මෙම වැඩසටහන සඳහා මන්නාරම ගෝරිඅම්බාල් රෝමානු කතෝලික දමිළ මිශ්‍ර පාසලේ සිසු සිසුවියන් සහ නාගතාලු ප්‍රදේශයේ ප්‍රදේශවාසීහු රැසක් ද එක්වූහ.

## හිසට සෙවනක් කුසට අහරක්





8 බලඇණි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භට පිරිස් අම්පාර දමන ප්‍රදේශයේ අඩුආදායම්ලාභී පවුලක් සඳහා නව නිවසක් ඉදිකරදෙනු ලැබූහ. ඉකුත් ඔක්තෝම්බර් මස 09 වන දින 241 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එල්එල්ඩීඑන් පතිරත්න ආර්එස්පී යූඑස්පී සහ 242 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේපීඑල් අමුණුපුරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එම නිවස භාරදීමේ කටයුතු සිදු කෙරුණි. 8 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරී මේජර් ඊඩීඑස්කේ දෙනියාය ගේ මූලිකත්වයෙන් සිදුකරනු ලැබූ මෙම ව්‍යාපෘතිය සඳහා එම ඒකක භටපිරිස් සහ ප්‍රදේශයේ දානපතියන් මූල්‍ය දායකත්වය ලබා දෙනු ලැබූහ. තවද, මෙම වැඩසටහනට සමගාමීව ප්‍රදේශයේ ගැබිණි මව්වරුන් 25 දෙනකු සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ ඇසුරුම් ද බෙදාදෙනු ලැබීය.

## නව ඇරඹුමක මතක සටහන්



ඉකුත් නොවැම්බර් මස 11 වන දින 1 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස වැඩ භාරගත් මේජර් එම්ඒඑන්සී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී වෙත එම ඒකක භටපිරිස් වෙතින් කඳවුරු සම්මාන මුරයක් පිරිනැමුණි. එහිදී, ඔහු ඒකකයේ ඉදිරි ක්‍රියාන්විත, පාලන හා සුබසාධන කටයුතු පිළිබඳ දැනුම්වත් කරමින් එහි භටපිරිස් ඇමතීමට ද කටයුතු කළේය.

# වාහන නඩත්තු කිරීම සහ අලුත්වැඩියාව සඳහා නව අංගනයක්





මෙහෙයුම් සූදානම ඉහළ නැංවීමේ සහ වාහන නඩත්තු කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස 24 වන පාබල සේනාංකය විසින් නවතමයෙන් වාහන අංගනයක් ඉදිකරන ලදී. එහිදී, සන්නද්ධ රථ, සැහැල්ලු වාහන අලුත්වැඩියා කිරීම සහ නවීකරණය කිරීම සඳහා විශේෂිත උපකරණ ඇතුළත්ව මෙම වාහන අංගනය ඉදිකර තිබීම විශේෂත්වයකි.

24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්ඒසී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ ඉදිකළ මෙම වාහන අංගනය පසුගිය ඔක්තෝබර් මස 16 වන දින විවෘත කෙරිණ.

# ඉංජිනේරු සේවා කාර්ය පටිපාටිය පිළිබඳ වැඩමුළුවක්



23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පී කාරියවසම් ගේ උපදෙස් හා මගපෙන්වීම මත එම පාබල සේනාංකය යටතේ රාජකාරි කරනු ලබන නිලධාරි හා සෙසුනිලයින්ගේ ඉංජිනේරු සේවා කාර්ය පටිපාටිය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩමුළුවක් පසුගිය ඔක්තෝබර් මස 25 වන දින සේනාංක මූලස්ථානයේදී පැවැත්විණ. 31 ඉංජිනේරු සේවා බලඝණයේ නිලධාරි අණදෙන මේජර් යූජීබීඑස් අබේගුණවර්ධන විසින් එම දේශනය මෙහෙය වන ලදී. එහිදී, ඉංජිනේරු සේවා බලකායේ වගකීම් හා කාර්යභාරය, කඳවුරු බැඳීම සහ හැරයාම මෙන්ම ඉසේරෙ සේවාවන් ලබා ගන්නා ක්‍රියා පටිපාටි වැනි වැදගත් මාතෘකා රැසක් පිළිබඳ සාකච්ඡා කෙරිණ.

# විරු සරණින් නව නිවසක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සරයට සමගාමීව මහ ඇලගමුව කැකිරාව ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී කේ. ජයසිංහ යන අය වෙනුවෙන් අභිනවයෙන් ඉදිකරන ලද නිවසක් ඔහු වෙත පවරාදීම ඉකුත් නොවැම්බර් මස 03 වන දින සිදුකෙරිණ. 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට 212 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්එම්සී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ විශේෂ ආරාධිතයකු වශයෙන් මේජර් ජෙනරාල් පීඒඑම් පීරිස් (විශ්‍රාමික) ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහභාගී වූහ. අංක 04, ද සේරම් පාර, ගල්කිස්ස ලිපිනයෙහි පදිංචි රෝහන් ගුණසේකර යන අයගේ අනුග්‍රහයෙන් මෙම නිවස ඉදිකිරීම සඳහා 7 (සේවා) ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා ඒකක හටපිරිස් ශ්‍රමදායකත්වය සැපයූහ.

# විරු දිරියෙන් ප්‍රජාසත්කාර රැසක්





241 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එල්එස්ඩීඑන් පතිරත්න ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම යටතේ එම බලප්‍රදේශය තුළ පසුගිය ඔක්තෝබර් මස 06 වන දින ප්‍රජාසත්කාර රැසක් සිදුකෙරිණ. ඒ අනුව 11 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරීගේ පූර්ණ අධීක්ෂණයෙන් එහි භටපිරිස් හා ප්‍රදේශයේ සිවිල් ජනතාව එක්ව අම්පාර ප්‍රදේශයේ නිත්ත සිට ඉලුක්චේන දක්වා දිවෙන ග්‍රාමීය මාර්ගය ප්‍රතිසංස්කරණය කරනු ලැබූහ. තවද, 18 විජයබාහු පාබල රෙජිමේන්තු භටපිරිස් විසින් ද පාණ්ඩිරිප්පු "විෂන් හෝප්" දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ළමුන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාගයක්ද සිදු කළහ. පසුගිය ලෝක ළමා දිනයට සමගාමීව සිදුකළ මෙම මාහැඟි සත්කාරයේදී එම දරුවන් වෙනුවෙන් දිවා ආහාරය ද පිරිනැමුණි.



## ඇස් කණ්ණාඩි පරිත්‍යාගයක්

212 වන පාබල බලසේනා බල ප්‍රදේශයේ පෙනීමේ දුර්වලතා ඇති පාසල් සිසුන් තිදෙනෙක් සඳහා ඇස් කණ්නාඩි බෙදාදීමේ වැඩසටහනක් එම බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්එම්සී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් මස 09 වන දින සිදුකෙරිණ.

## දිවා ආහාර වේලක් පරිත්‍යාග කිරීමේ වැඩටහනක්



10 (සේවා) විජයබාහු පාබල රෙජිමේන්තු අණදෙන නිලධාරී හා එම ඒකක භටපිරිස් ඉකුත් නොවැම්බර් මස 18 වන දින ප්‍රජා සත්කාරයකට දායක වූහ. එහිදී, ඔවුන්ගේ මැදිහත්වීමෙන් ජේ/426, වැම්පියන් වත්ත (උ) ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සෙන්ත් පිල්ස් මේරිස් පෙර පාසලේ ළමුන් සහ ගුරුවරියන් වෙනුවෙන් පෝෂණදායී දිවා ආහාර වේලක් ලබාදීමට කටයුතු කෙරිණ.

# ඇවිදින්නට වාරුවක්

22 වන පාබල සේනාංකයේ මගපෙන්වීම යටතේ එම මූලස්ථානය තුළ දී පසුගිය ඔක්තෝම්බර් මස 17, 18 සහ 19 වන දින කෘත්‍රිම පාද බෙදාදීමේ වැඩසටහනක් පවත්වන ලදී. දෙපා වාරු නොමැති, දැනට රෝද පුටුවක් මතින් හෝ අත්වාරුවක උපකාරයෙන් ගමන් කරනු ලබන අපේම මිනිසුන් වෙනුවෙන් ඇවිදින්නට වරම් හිමිකරදීම එහි අරමුණ විය. මේ සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලද්දේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය, එම සේවා වනිතා ශාඛාව, කොළඹ අසරණ සරණ සමිතිය, කැපිටල් සිටි රොටරි සමාජය හා ලංකා අශෝක් ලේලන්ඩ් ආයතන විසිනි.





මෙහිදී, පාද දෙකම අහිමි අයකුට හා පාදයක් අහිමි 25 දෙනකු සඳහා කෘත්‍රිම පාද 27 ක් ප්‍රදානය කරන ලද අතර එම පාද බෙදා දීමේ අවස්ථාව සඳහා 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සමග කොළඹ අසරණ සරණ සමිතියේ හිටපු සභාපති සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික සුපෙම් ද සිල්වා, කැපිටල් සිටි රොටරි සමාජයේ වත්මන් සභාපති හේමන්ත අපොන්සු, වෛද්‍ය සන්දුල් අපොන්සු සහ කැපිටල් සිටි රොටරි සමාජයේ හිටපු සභාපති ගිහාන් පණ්ඩිතරත්න, වෛද්‍ය සංජීව් රාජපක්ෂ, කොළඹ අසරණ සරණ සමිතියේ කළමනාකාර මණ්ඩල සාමාජික, ත්‍රිකුණාමලය රොටරි සමාජයේ සභාපති එස් ජෙගන්ෂ්වරන් ඇතුළු මහත්වරු සහ 222 හා 223 වන පාබල බලසේනා බලසේනාධිපතිවරු ද සහභාගී වූහ.

# තැන තැන සෙවන සදන රණවිරු මෙහෙවර





මින්නේරිය, මහරත්මලේ ප්‍රදේශයේ වාසය කරනු ලබන සෙ/167900 බොම් කුමාර එච්එම්ඒපී යන කොමිෂන් නොලත් නිලධාරී හට ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ 7 වන සැහැල්ලු රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිල සහයෝගයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සරයට සමගාමීව ඉදිකරන ලද නව නිවසක් ඉකුත් ඔක්තෝබර් මස 30 දින පරිත්‍යාග කරනු ලැබූහ.

එම කොනොනි තම දරුවන් තිදෙනා සහ බිරිඳ සමග ජීවත් වන අතර, නිසි නවාතැන් පහසුකම් නොමැතිකම හේතුවෙන් කලක පටන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දී සිටි අයෙකි. එබැවින් 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීමෙන් සහ 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ මෙම සත්කාරය සිදුවිය. මේ සඳහා අවශ්‍ය මූල්‍ය සහ ද්‍රව්‍යමය ආධාර සපයා තිබුනේ 7 සැහැල්ලු කාලතුවක්කු රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙබළුන් ඇතුළු පරිත්‍යාගශීලීන් කිහිපදෙනකු විසිනි.

මෙම නිවස භාරදීමේ අවස්ථාවට නැගෙනහිර ආරක්ෂක සේනාව ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පි ආර්එස්පී විඑස්වි යූඑස්පී පීඑස්සී ප්‍රධානත්වය දැරීය.

# සොබා සිතුවිලි



## අහිමි වුවද සිතින් ළඟමයි...



සිත් දැලේ දඟ කරපු
අහිමි බව දැන දැනත්
සිත් බැඳුණු
ඇහිපිල්ලම් යට සැඟවුණ
කඳුලු පිසදා සුවඳ තැවරූ වත්සුනු
අදත් මතකයි එදා වාගේම
දුන්නු උණුසුම සුයාමයක
ඉතිං අප හමුවනවිට
නෙතින් සිනාසී සිතින් කතා කරමු
යළි හමුවෙනා භවයක් ගැන

සෙ/එස්10003
කෝප්‍රල් ලලිත් ඕකේ

## විරුවකුට බිරිඳක්ව...

තරු කැට ද නිදි කිරා වැටෙනා
නිසංසල රෑ මැදියමේ
ඔබේ නාමෙන් අකුරු කරනෙමි
දයාබර බව හදවතේ...
බොහෝ ඈතක රැඳෙන මුත් ඔබ
නුවන් නොදකින මායිමේ...
සිතින් නිරතුරු රැඳී ඉන්නම්
ශක්තියක් වී ඔබ සිතේ...

වනීතා වික්‍රමසිංහ
හෝමාගම

## උපන්දින තෑග්ග...

එදා මෙන් අදත්
ඔබගේ උපන් දිනය
සමරන්නට ආවා මම
ඔබ කැමතිම ඇඳුම ඇඳ
එදා නොතිබූ රෝස මල්
අද පිපී ඇත ඔබ වට
එපා මට රෝස මල්
පුදන්නට ඔබ හට
ගෙනාවා රතු පොපි මලක්
ඔබේ නාමෙන් පිබිදුන

සෙ/753797
කෝප්‍රල් කුමාරසිංහ එම්පීඑම්
11 ඉසේරෙ



## ඒ මතක එහෙමමයි...

අතුකොළ රේණු පරමල් බිමට හැලී හැලී
නතුකළ සොබාදම දිවි අරුත ඇත දිලී
පැතු ලෙස නොවුණු පෙරදා මතක ඇලී ඇලී
රතු ලේ සමග මුසුව දවයි හද තැලී

දහසක් නොමැත එකමෙක හිතක ඇතුළත
පහසක් වින්ද නුඹමයි දන්නෙ හදවත
රහසක් කියමි අහිතක් වුවත් කම් නැත
අහසක් නොවෙද දකිනුයෙ ගසක මුදුනත

නෙත් කළ මතක හිත් තුළ තාම ඉතිරිය
සත්තම කියමි දුක් නොව ඇත්තෙ පුදුමය
මෙත් මිස වෛර කුමටද පෙමට හැරගිය
අත්හැර දමනු මිස වෙන සැපක් නොමැතිය

ලුතිනන් කර්නල් සුජිත් චමින්ද වැදිරසිංහ



## උඩගු ලිය...

තොල් රතු කර මුත් සිනහවක් නොමැති
කෙහෙරැල් සුළඟට පාවුනද
රළු පෙනුමැති
උස් අඩි පැලඳුවද
පිටත් වඩා උසින් යන
මානෙන් පුහු වූ රුවැත්තී...

කපිතාන් එච්පීජේ භවන්ති
1 ශ්‍රීලයුකාබ







# අකුරු කරන දරුවන්ට මිතුරු සත්කාරයක්




අවම පහසුකම් සහිත අම්පාර ගල්කන්ද ප්‍රාථමික පාසලේ දරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා පසුගියදා භාණ්ඩ පරිත්‍යාගයක් සිදුකෙරිණ. 24 වන පාබල සේනාංකයෙහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් මස 28 වන දින සිදුකළ මෙම පරිත්‍යාගයේ දී එම පාසල් තූර්ය වාදක කණ්ඩායම සඳහා සංගීත භාණ්ඩ තොගයක්ද අත්‍යවශ්‍ය පාසල් උපකරණ බෙදාදීමක් ද සිදු කෙරිණි. ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) කර්නල් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී කර්නල් බීඩීටීඩී ජයරත්න පීඑස්සී සහ මහාචාර්ය කොමදී කරුණාගොඩ මහත්මිය මෙම කටයුත්ත සම්බන්ධීකරණය කළහ.

ශ්‍රී ශාක්‍යමුණි සම්බුද්ධ විහාරයෙහි විහාරාධිපති වශයෙන් කටයුතු කරන අති පූජ්‍ය ශාස්ත්‍රපති පණ්ඩිත දිගාමඩුල්ලේ විමලානන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් සහ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි "ශාක්‍ය තරුණ" සමූහයේ මූල්‍යාධාර මත මෙම වැඩසටහන සිදුකෙරිණ. සිවිල් ජනතාවගේ අධ්‍යාපන හා සමාජ තත්වය වර්ධනය කිරීම වෙනුවෙන් යුද හමුදාවේ කැපවීම මෙවැනි ක්‍රියා මගින් මනාව විදහාපාන අතර එමගින් යුද්ධ හමුදාව පිළිබඳව සිවිල් ජන සමාජය තුළ ධනාත්මක ආකල්පයන් ඇතිවීමට ද හේතු වේ.

## 1 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට නව නිලධාරී නිවස්නයක්



1 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අභිනවයෙන් ඉදිකරන ලද නව නිලධාරී නිවස්නය ඉකුත් නොවැම්බර් මස 06 වන දින විවෘත කෙරිණ. 1 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් පීඒඒඑස් පෙරේරා ගේ ආරාධනයෙන් සපැමිණි එම රෙජිමේන්තු කර්නල් සේනාවිධායක සහ ශ්‍රී ලංකා යුද හමුදා ජනමාධ්‍ය හා මනෝ විද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් කේ ඒඑන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් එය විවෘත විය. සියලු පහසුකම්වලින් සමන්විතව ඒකක සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් මනස්කාන්ත ලෙස ඉදිකර ඇති මෙම නිලධාරී නිවස්නය මෙතෙක් එම ඒකකයට විශාල අඩුපාඩුවක් සම්පූර්ණ වීමකි.





අප මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් තම කාය දානය ලබාදී රණක්ෂිතයට පත්ව මිහිඳු සෙත් මැදුර අත්තිඩිය සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන විරෝදාර රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඉකුත් නොවැම්බර් මස 05 වන දින සංචාරයක නිරතවූවාය. එහිදී, ප්‍රතිකාර ලබන රණවිරුවන් දෙදෙනකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඔවුන් වෙත විද්‍යුත් රෝදපුටු 02 ක් සහ උපස්ථායකයින් සඳහා වියළි සලාක මළු 30 ක් පරිත්‍යාග කිරීමද සිදුකෙරිණ.

මිහිඳු සෙත් මැදුර - අත්තිඩිය සුවසහන නිකේතනයෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජීඑස් ද එස් රාජකරුණා ආර්එස්පී යූඑස්පී ද මෙම අවස්ථාවට එක්විය. අනතුරුව, සභාපතිනිය සුවසහන නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන රණවිරුවන් සමඟ සුහද පිළිසඳරක නිරතවෙමින් ඔවුන්ගේ අවශ්‍යතාවයන්, පවුලේ සාමාජිකයින්ගේ ගැටලු පිළිබඳව ද කරුණු විමසනු ලැබූ අතර, එම රණවිරුවන් විසින් නිපද වූ අත්කම් නිර්මාණ ද ඇයගේ නිරීක්ෂණයට බඳුන් වූවාය.



# රණක්ෂිතයට පත් විරුවන්ගේ සුවදුක් විමසයි...








# හෙට දින දිනන දරුවන්ට අත්වැලක්




යුද්ධ හමුදා ඒකක, කාර්යාල යටතේ සේවය කරනු ලබන සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ සුබ සාධනය සැලසීම වස් ඔවුන්ගේ පාසල් යන දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 21 වන දින සේවා වනිතා ඒකක කාර්යාලයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ තුමිය වන හසිනි පල්ලාවල මහත්මිය ගේ ඉල්ලීමකට අනුව සිදුකළ මෙම සත්කාරයේදී 2025 වර්ෂයේ නව පාසල් වාරය සඳහා තෝරාගත් දරුවන් 250 දෙනකු වෙත එම පරිත්‍යාග පිරිනැමිණ. යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනිය විසින් අදාල පාසල් උපකරණ තොගය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ තුමිය වෙත සංකේතාත්මකව භාරදෙනු ලැබුවාය.

# වියළි සලාක පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්







ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය හා නැගෙනහිර බලප්‍රදේශ තුළ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් 200 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 05 වන දින යුද්ධ සේවා වනිතා ඒකක කාර්යාලයේ දී සිදුකෙරිණ. එසේම, ආරක්ෂක සේනා මූලස්ථානය වන්නි සහ මධ්‍යම යටතේ සේවයේ නියුතු යුද්ධ හමුදා සහ සිවිල් සාමාජිකයින්, 200 දෙනකු උදෙසා එවැනි සලාක බෙදාදීමක් ද ඉකුත් නොවැම්බර් මස 08 වන දින සිදුවිය. යුද්ධ හමුදා සාමාජිකයින්, සිවිල් සේවක මහත්ම මහත්මීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා ආර්ථික සහනයක් සලසාදීමේ අරමුණින් සංවිධානය කරන ලද මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ප්‍රධානත්වය දැරුවාය.








# ගිලන් හිත්වලට දිරිදී






රණක්ෂිතයට පත්ව අභිමංසල *I, II, III* සුවසහන නිකේතනවල මෙන්ම මිහිඳු සෙත් මැදුර සහ රාගම රණවිරු සෙවනෙහි ප්‍රතිකාර ලබන රණවිරුවෝ බොහෝ වෙති. ඔවුනගේ පරිහරණය සඳහා රෝදපුටු, කොමඩ් පුටු, කිහිලිකරු සහ වෙනත් වෛද්‍යාධාර උපකරණ තොගයක් රණසේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 13 වන දින පෙරවරුවේ රාගම රණවිරු සෙවණෙහිදී පැවැත්විණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට රණවිරු සේවා සහ පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඒඑස්ආර් විජේදාස ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී, රණවිරු සෙවණ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩීඑම් කුමාරසිංහ ආර්එස්පී ඇතුළු පිරිසක් සහභාගී වූහ. එහිදී, සේවා වනිතා සභාපතිනිය විසින් එම රණවිරුවන්ගේ නේවාසික වාට්ටු වෙත ගොස් සුහද කතාබහක නිරත වෙමින් ඔවුන්ගේ අවශ්‍යතාවයන්, පවුලේ සාමාජිකයින්ගේ පවතින ගැටලු ආදිය පිළිබඳව සම්පව කරුණු විමසමින් ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාවය ඉහළ නැංවීම වෙනුවෙන් වන චිකිත්සක ප්‍රතිකාරවල ප්‍රගතිය ද විමසා බැලුවාය.

# මාසික මහ සභා රැස්වීමේදී සත්කාර රැසක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 2024 වර්ෂයේ නොවැම්බර් මස මාසික සභා රැස්වීම එහි සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් නොවැම්බර් 25 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී, එම රැස්වීමට සමගාමීව සභාපතිනිය විසින් රණවිරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුබසාධනය උදෙසා පරිත්‍යාග කිහිපයක් ද සිදුකරන ලදී. ඒ අනුව විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ රාජකාරී නියුතු රණවිරුවන් 04 දෙනකු හට රුපියල් 600,000.00 බැගින් වූ නව නිවාසාධාර 04 ක්ද, අඩක් වැඩ නිමකර ඇති නිවෙස්වල ඉතිරි වැඩ කටයුතු සිදුකර ගැනීම සඳහා රණවිරුවන් 05 දෙනකු හට රුපියල් 450,000.00 බැගින් වූ අර්ධ නිවාසාධාර ද තවත් රණවිරුවන් කිහිපදෙනකුට සිය නිවෙස්වල ඉතිරි වැඩ කරගැනීම සඳහා රුපියල් 250,000.00 බැගින්ද පිරිනමන ලදී.

එමෙන්ම පවතින ආර්ථික අපහසුතාවන් සඳහා සහනයක් ලබාදීමේ අරමුණින් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ රාජකාරී නියුතු රණවිරුවන් සහ සිවිල් සේවකයින් 30 දෙනකුට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පිරිනැමීමට ද එම බලකායේ රාජකාරී නියුතු රණවිරුවන් 30 දෙනකුගේ පාසල් යන දූ දරුවන්ට පාසල් උපකරණ බෙදාදීමට ද කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ රාජකාරී නියුතු රණවිරුවන් සහ සිවිල් සේවකයින් 100 දෙනකු හට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමටද එහිදී කටයුතු කෙරිණ.



# සිංහ දරු දැරියන්ට විරියක්



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ රණවිරු දූ දරුවන් හට ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 30 වන දින මහනුවර 2(සේවි) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු පරිශ්‍රයේදී පැවැත්විණ. යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සහ එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛා සභාපතිනි නෙලූකා නානායක්කාර මහත්මිය මෙම අවස්ථාවට ප්‍රධානත්වය දැරූහ. මේ යටතේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් රණවිරුවන්ගේ 2022/2023 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 170 කට වඩා ලබාගත් දූ දරුවන් 18 දෙනකුටද, 2023 වර්ෂයේ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් විශිෂ්ට සාමාර්ථ 08 කට වඩා ලබාගත් දූ දරුවන් 12 දෙනකුටද, 2023 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් සමත්ව සරසවි වරම් ලැබූ දූ දරුවන් 06 දෙනකුටද ශිෂ්‍යත්ව ආධාර මුදල් ප්‍රදානය කෙරිණි. තවද, 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දූ දරුවන් 18 දෙනා හට ශිෂ්‍යාධාරවලට අමතරව සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ භාණ්ඩාගාරික නෙත්මිනි මුතුමාල මහත්මියගේ සම්බන්ධීකරණය මත මහනුවර ජාතික සංවර්ධන බැංකුව වෙතින් පාසල් පාවහන් යුගල බැගින්ද ප්‍රදානය කරන ලද අතර, අදාල ශිෂ්‍යත්ව ලබාදීම වෙනුවෙන් රුපියල් 570,000.00 පමණ මුදලක් වැයදරා ඇත.





# සූපවේදී වැඩමුළුවක්

ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් රණවිරුවන් වෙනුවෙන් සිදුකරනු ලබන සුභසාධන කටයුතුවල තවත් පියවරක් ඉදිරියට තබමින් එම රෙජිමේන්තු නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ භාර්යාවන් 150 කගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු සූපවේදී වැඩමුළුවක් ඉකුත් නොවැම්බර් මස 09 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දර්ශණී යහම්පත් මහත්මියගේ අදහසකට අනුව ක්‍රියාත්මක මෙම වැඩමුළුවට නෙස්ලේ ලංකා පුද්ගලික සමාගමේ අනුග්‍රාහකත්වය හිමිවිය. එහිදී, "සුවදායී හා පෝෂදායී ආහාර" යන තේමාව යටතේ එම ආයතනය වෙතින් ඊට සහභාගි වූ පිරිස වෙත විවිධ ප්‍රශ්න ඉදිරිපත් කරමින් ඒවාට පිළිතුරු ලබාදුන් අය වෙත ත්‍යාග පිරිනැමීමට ද කටයුතු කිරීම විශේෂත්වයකි. ප්‍රවීන සූපවේදිනී රෝෂිනී පෙරේරා මහත්මිය විසින් මෙම වැඩමුළුව මෙහෙයවන ලදී. තවද, එම වැඩමුළුව අවසානයේ ඒ සඳහා සහභාගි වූ සියළු දෙනා වෙත දිවා ආහාරය ලබාදීමට ද කටයුතු කෙරිණි.

සෙබළුන්ගේ ආර්ථික තත්වය ඉහළ නැංවීම සඳහා නෙස්ලේ ආශ්‍රිත නිෂ්පාදන යොදා ගනිමින් ආහාර වර්ග නිෂ්පාදනය කර ස්වයං රැකියා සඳහා යොමු කිරීම මෙම වැඩමුළුවේ එක් සුවිශේෂී අරමුණකි. එසේම, ස්වයං රැකියා ආරම්භ කිරීමේ අපේක්ෂාවෙන් සිටින රණවිරු පවුල් වෙනුවෙන් මූලික උපකරණ සහ අමුද්‍රව්‍ය සහනදායී මිල ගණන් යටතේ ලබාදීම සඳහා අනුග්‍රහය දැක්වීමටද නෙස්ලේ ලංකා ආයතනය එකගතාව පළකර තිබේ. එම නිෂ්පාදන පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් පවත්වාගෙන යනු ලබන අවන්හල් වෙතින් අලෙවිකර ගැනීමට ද අවස්ථාව සැලසේ. මෙම වැඩමුළුවට පාබල හමුදා මධ්‍යස්ථාන සේනාවිධායක, එම සේවා වනිතා සාමාජිකාවෝ, නෙස්ලේ ලංකා පුද්ගලික සමාගමේ විකුණුම් සහ ප්‍රවර්ධන කළමනාකාර අයේෂ් ලසන්ත මහතා ඇතුළු එම කාර්ය මණ්ඩල සාමාජිකයෝ ද සහභාගී වූහ.





# හෙටලොව දිනන දිවියට සවිය

14 රොකට් රෙජිමේන්තුව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව, එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව සහ සිල්වර්මීල් "Silvermeal" පදනම ඒකාබද්ධව ඉකුත් ඔක්තෝබර් මස 24 වන දින කාලංකුට්ටිය ප්‍රදේශයේදී පරිත්‍යාග වැඩසටහනක් පැවැත්විය. එහිදී, පවුල් සුබසාධනය සහ තිරසාර බව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ගර්භිනී මව්වරු 20 දෙනකු වෙනුවෙන් වියළි සලාක පාර්සල් සහ ගොවි මහතුන් 80 දෙනකු වෙනුවෙන් පොල් පැළ 700 ක් පරිත්‍යාග කෙරිණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ බලකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ඉල්ලීමකට අනුව සිල්වර්මීල් පදනමේ සභාපති මේජර් ජෙනරාල් ශිරාන් අබේසේකර (විශ්‍රාමික) ආර්එස්පී යූඑස්පී මෙම වැඩසටහන සඳහා අවශ්‍යමය පරිත්‍යාගයන් සිදුකරනු ලැබීය.





# අකුරු කරන්නට දිරියක්

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ පාසල් පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 08 වන දින පනාගොඩ, ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ගංගා හේරත් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනේ දී ලක්ෂ 48 ක පමණ වටිනාකමකින් යුත් පොත් ප්‍රදානය කෙරුණි. එහිදී, පොත් පාර්සල් 2,082 ක් අතුරින් පාර්සල් 90 ක්, කොළඹ සහ ඒ අවට ප්‍රදේශයන්හි පදිංචි එම රෙජිමේන්තුවේ රාජකාරි කරනු ලබන සෙනින්ගේ දරුවන් වෙත සංකේතාත්මකව ප්‍රදානය කෙරුණු අතර, මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ, නිලධාරීන්, සෙසුනිලයන් සහ ප්‍රතිලාභී ළමුන් සහභාගී වූහ.






# එළිය දකින්නට සවියක් ලැබෙයි

ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛා සභාපතිනි ප්‍රියංගා වික්‍රමසිංහ මහත්මියගේ මගපෙන්වීම මත එම සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කරන ලද ඇස් කණ්නාඩි ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 20 වන දින ගජබා රෙජිමේන්තු පරිශ්‍රයේ දී පැවැත්විණ. යාපනය ආරක්ෂක සේනා ආඥාපති සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම වැඩසටහන මගින් ප්‍රදේශවාසීන් 381 දෙනෙක් වෙනුවෙන් ප්‍රතිලාභ හිමිගැන්විණ. ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමයේ සහය ඇතිව මෙම මාහැඟි ප්‍රජා සත්කාරය සිදුවිය.






## අකුරු කරන්නට මිතුරු සත්කාරයක්

යාපනය 51 සහ 52 වන පාබල සේනාංක යටතේ පාලනය වන 7 සහ 11 විජයබාහු පාබල රෙජිමේන්තු බලප්‍රදේශ තුළ ස්ථාපිත අඩු ආදායම්ලාභී දරුවන් ඉගෙනුම ලබන පුත්තූර් මඩිහේ පඤ්ඤාසිහ විද්‍යාලය හා කරවෙඩ්ඩි ශ්‍රී නාරද විද්‍යාලය, යන පාසල්වල දරුවන් 97 දෙනකු හට පාසල් උපකරණ කට්වල බෙදාදීමේ වැඩසටහනක් පසුගියදා සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛා සභාපතිනිය නියෝජනය කරමින් එහි ජ්‍යෙෂ්ඨ සාමාජිකා ආචාර්ය කොමදී කරුණාගෙ ාඩ මහත්මිය සමගින් එහි සාමාජිකාවෝ සහ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.





## විරු දිරියට සත්කාරයක්

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායට අයත් ක්‍රියාන්විත රාජකාරීන්හි යෙදී සිටියදී මාතෘ භූමිය වෙනුවෙන් දිවි පිදූ වීරෝදාර රණවිරුවන් ස්මරණය කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 23 වන දින ගන්නෝරුවෙහි පිහිටි එම බලකා රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණ. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ 75 වන සංවත්සරයට සමගාමීව එහි රණවිරු පවුල්වල ඥාතීන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම වැඩසටහනේ දී ඔවුන් වෙත පෝසිලේන් භාණ්ඩ ඇතුළත් තෑග පාර්සල් ද පිරිනැමිණ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු පුහුණු පාසලේ පූර්ණ දායකත්වය ඇතිව, එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම කෘතගුණ දැක්වීමේ වැඩසටහන සඳහා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන හා එම රෙජිමේන්තු බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඑච්එම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ද එක්විය. තවද, මෙම අවස්ථාවට විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ මෙන්ම නිලධාරීන් හා සෙබළුන් රැසක් සහභාගී වූහ.





## රණවිරු සුවයට වෛද්‍ය සායනයක්

විශේෂ බලකා සේවා වනිතා ශාඛාව සහ නාඋල මහ රෝහල එක්ව ඉකුත් නොවැම්බර් මස 01 වන දින 1 විශේෂ බලකා සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ භාර්යාවන් සඳහා වෛද්‍ය සායනයක් එම කඳවුරු පරිශ්‍රයේ දී පවත්වන ලදි. වන්නි ආරක්ෂක සේනා ආඥාපති සහ විශේෂ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහ එම සේවා වනිතා ශාඛා සභාපතිනි අනෝජා පීරිස් මහත්මියගේ මගපෙන්වීම යටතේ පැවති මෙම වැඩසටහනට වෛද්‍ය පණ්ඩුල විජේසූරිය සහ නාලන්දා රෝහල් කාර්ය මණ්ඩලයේ දායකත්වය ද හිමිවූහ. මෙම වැඩසටහන මගින් නිලධාරීන්, සෙබළුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ඇතුළු පුද්ගලයින් 100 දෙනකුට අත්‍යවශ්‍ය සෞඛ්‍ය පරීක්ෂණ සිදුකිරීම් සහ වෛද්‍ය උපදේශන ලබාදීම සිදුකෙරිණ.

# ගර්භිනී මව්වරුන්ට සත්කාරයක්





සන්නද්ධ බුද්ධි බලකාය යටතේ රාජකාරි නියුතු සෙසුනිලයින්ගේ ගර්භිනී තත්වයේ පසුවන බිරින්දෑවරු 26 දෙනකු හට අවශ්‍යතා ලබා දීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 17 වන දින එම මධ්‍යස්ථානයේදී සිදුකෙරිණ.

එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හංසිකා මහලේකම් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සත්කාරයේදී පැමිණ සිටි ගර්භිනී මව්වරුන් සඳහා කොළඹ ජාතික රෝහලේ විද්‍යාවේදී ජ්‍යෙෂ්ඨ හෙද නිලධාරිනියක් ලෙස සේවය කරනු ලබන තනූජා සුහසිංහ මහත්මිය විසින් ඉතාමත් හරවත් වූ දේශනයක් ද පවත්වනු ලැබුවාය. මෙම අවස්ථාවට එම සේවා වනිතා සාමාජිකාවෝ රැසක් එක්වූහ.





## 106 වසරක අභිමානය සමරා

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායට අයත් රාජකාරි නියුතු සාමාජිකයින් හා සිවිල් සේවක මහත්වරුන් හට ආශිර්වාද පැතීමත් මියගිය රණවිරුවන් හට පිං අනුමෝදන් කිරීමත්, රණක්ෂිතයට පත් රණවිරුවන්ට නීරෝගී සුවය ප්‍රාර්ථනා කිරීමත් අරමුණු කරගනිමින් ආශිර්වාද බෝධි පූජා පිංකමක් ඉකුත් ඔක්තෝබර් මස 30 වන දින පනාගොඩ ශ්‍රී බෝධිරාජාරාමයේ දී පැවැත්වුණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායට වසර 106 ක් පිරීම නිමිත්තෙන් එම බලකා සේවා වනිතා ශාඛාව විසින් සංවිධානය කළ මෙම බෝධි පූජා පිංකම ගරුතර වේයන්ගොඩ මොට්ටුන්න කිරිවාරාම පැම්පිට පුරාණ විහාරාධිවාසී වේයන්ගොඩ ශ්‍රී පඤ්ඤාසාර පිරිවෙන් නියෝජ්‍ය පරිවේණාධිපති ශාස්ත්‍රපති රත්නපුරේ ධම්මිස්සර ස්වාමින් වහන්සේ විසින් මෙහෙයවනු ලැබූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් හා සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේ රාජපක්ෂ ආර්එස්පී සහ සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්ෂ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම බෝධි පූජා පිංකමට අධ්‍යක්ෂ ජෙනරාල් සැපයීම් හා ප්‍රවාහන මේජර් ජෙනරාල් ඊඑම්ජීඒ අඹන්පොල හා සේවා බලකා සේවා වනිතා උප සභාපතිනි මධුවන්ති අඹන්පොල මහත්මිය ඇතුළු නිලධාරීන්, නිලධාරිනියන්, සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන් සහ එම බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.







## 5 වසර ශිෂ්‍යත්ව වැඩසටහනක්

වෛද්‍ය බලකා සාමාජිකයින්ගේ දූවා දරුවන් වෙනුවෙන් 2023 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් හට ත්‍යාග ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 09 වන දින එහි බලකාධිපති මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී හා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය කල්‍යාණි විජේරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා රෝහල් ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. මෙහිදී, දරුවන් 41 දෙනකු හට රුපියල් 10,000.00 ක බැංකු ගිණුම් බැගින් හා පාසල් උපකරණ පිරිනැමීම සිදුවිය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා රෝහල් අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන්, සෙබළුන් මෙන්ම වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.




# සිවිල් සේවක මහතුන්ට පරිත්‍යාගයක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සහ එම පුහුණු පාසලේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් 24 දෙනකු සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සහ වියලි සලාක ඇසුරුම් බෙදාදීමේ කටයුත්තක් ඉකුත් නොවැම්බර් මස 07 වන දින පැවැත්විණ. මෙම වැඩසටහන යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා ප්‍රනාන්දු මහත්මිය ගේ සහ හකාස අණසක ආඥාපති මෙන්ම යුධෝපකරණ බලකායේ කර්නල් සේනාධිධායක මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එම්ඩීඑම්සී එල්එස්සී ඒප්පීම් ගේ මගපෙන්වීම යටතේ සිදුකෙරිණ.





# ශාන්ත ලූකස් වැඩිහිටි නිවාසයේදී පරිත්‍යාග වැඩසටහනක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනීෂා කොතලාවල මහත්මියගේ මගපෙන්වීම යටතේ එම ශාඛාව සහ 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය එක්ව ඉකුත් ඔක්තෝබර් මස 26 වන දින පුත්තූර්හි ශාන්ත ලූකස් වැඩිහිටි නිවාසයේ දී පරිත්‍යාග වැඩසටහනක් පවත්වනු ලැබීය. එහිදී, නේවාසිකව සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත දෛනික අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය, වෛද්‍ය උපකරණ අඩංගු ඇසුරුම්, ආහාර සලාක සහ මදුරු දැල් ආදිය ලබාදෙන ලදී. මෙහිදී විනෝදාස්වාදජනක වැඩසටහක් ද පැවැත් වූ අතර, එහි අවසානයේ ඔවුන් වෙත දිවා භෝජන සංග්‍රහයක් ද පිරිනැමිණ.





# ලෝක ළමා දින සමරා දරුපැටවුන්ගේ එකතුවක්

ලෝක ළමා දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ විශේෂ ළමා ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 26 වන දින පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂක සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්කේජීපීඑස්කේ අබේසිංහ සහ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි අබේසිංහ මහත්මිය සහභාගී වූහ.

යුද්ධ හමුදා පොදුසේවා බලකායේ සේවයේ නියුතු සාමාජිකයන් සහ සිවිල් සේවක මහතුන්ගේ දූ දරුවන් 100 දෙනකු මෙම උත්සවය සඳහා සහභාගී වූහ. මෙහි මූලික අරමුණ වූයේ කණ්ඩායම් වැඩ සහ සහයෝගීතාවයේ ප්‍රායෝගික අත්දැකීම් දරුවන් වෙත ලබාදීමයි. එදින ළමුන් සඳහා විනෝදාස්වාද සැසියක් ද පැවැත්විණි. එහිදී, සෑම දරුවකුටම වටිනා ටී ෂර්ට් එකක් සහ වර්ණවත් ස්මා(ර්)ට් ඔර්ලෝසුවක් බැගින් ද ක්‍රියාකාරකම් අතරතුර ප්‍රනීත ආහාර ද සැපයිණ. තවද, ශාරීරික යෝග්‍යතා සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳව ආර්එම් රෝහාන් රත්නායක මහතා විසින් මෙහෙයවූ දේශනයක් ද එම වැඩසටහනට ඇතුළත්ව තිබූ අතර, ළමුන් සහ ඔවුන්ගේ දෙමාපියන් සඳහා විශේෂ දිවා භෝජන සංග්‍රහයක් ද පිරිනැමිණ. රෙජිමේන්තු මධ්‍යස්ථානයෙන් හා ඊට අයත් අනිකුත් ඒකක වෙතින් ලද සහයෝගීතාවය මත සංවිධානය කෙරුණු එම වැඩසටහනට සහභාගීවූවන් හට ප්‍රීතිමත් හා සාරවත් මතක ඉතිරි කළ අපූරු අවස්ථාවක් විය.

# ගැබිණි මව්වරුන්ට රැකවරණයක්







යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායෙහි මෙන්ම අවට ඇති අම්බලන්ගොඩ ඇල්පිටිය සහ කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි ගැබිණි මව්වරුන් 50 දෙනකු සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 26 වන දින 2(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ දී පැවැත්විණ. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වරුණි කුලතුංග මහත්මියගේ අදහසකට අනුව එම සේවාවනිතා සාමාජිකාවෝ මෙම සත්කාරය සංවිධානය කරනු ලැබූහ.

මෙම මව්වරුන් සඳහා 2(සේවා) ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා ඒකකය මගින් උදෑසන තේ සහ දිවා ආහාරය ද ලබාදුන් අතර, ගර්භිණී මව්වරුන් උදෙසා වෛද්‍ය ටී ප්‍රනීත් විසින් කාලෝචිත දේශනයක් ද සිදුකරන ලදී. නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායෙහි කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එස්ජී කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ප්‍රධානත්වය දැරූ මෙම අවස්ථාවට එම බලකා මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් සහ සේවාවනිතා සාමාජිකාවෝ රැසක් ද එක්වූහ.

# සුබ මොහොතින් රාජකාරි අරඹයි



ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස දිල්රුක්ෂි විමලරත්න මහත්මිය ඉකුත් නොවැම්බර් මස 23 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී රාජකාරී භාරගනු ලැබුවාය. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් ද එක්වූහ.






# නව නිවසක් සඳහා අතහිත

3(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායට අයත් සෙ/5ආර්100176 මාණ්ඩලික සැරයන් නයනකාන්ති කේජීඑම් (විශ්‍රාමික) යන ජ්‍යෙෂ්ඨ කොනොනිට මහත් අඩුවක්ව පැවති ඇයගේ අර්ධ වශයෙන් ඉදිකර තිබූ නිවසෙහි ඉතිරි වැඩ නිමකරදීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාව මැදිහත් විය. එහි සභාපතිනි උදුලා කස්තුරිමුදලි මහත්මියගේ මගපෙන්වීම මත ඉදිකර අවසන් කරනු ලැබූ මෙම නිවස සඳහා අවැසි මූල්‍ය පරිත්‍යාගය එම ශාඛාව විසින් සපයන ලදී. 4 ඉංජිනේරු සේවා රෙජිමේන්තුව සහ කාන්තා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සෙනීන් ශ්‍රම දායකත්වය ඊට සැපයූහ. ඉකුත් ඔක්තෝබර් මස 16 වන දින මෙම නිවස භාරදීමේ අවස්ථාව සඳහා එම සේවා වනිතා සාමාජිකාවෝ, නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.





# මැදපෙරදිග යුද්ධය III වන ලෝක සංග්‍රාමයකට අත වැනීමක්ද?





## අර්බුධය පිළිබඳ දැනුවත් වීම වැදගත් වන්නේ ඇයි?

මේ දිනවල මුළු ලෝකයම භීතියට පත් කරන තවත් ප්‍රධාන කරුණක් වනුයේ ඇවිලෙන මැදපෙරදිගයි. එක පසෙකින් අතිශය දියුණු තාක්ෂණයකින් හෙබි ඊශ්‍රායලයද, අනෙක් පසින් නිදහස් දේශයක් උදෙසා සටන් වදින පලස්තීන හමාස් සංවිධානයේ සටන්කාමීන් මෙන්ම මුළු ලෝකයම භීතියට පත් කරමින් දීර්ඝකාලීන ඊශ්‍රායල පලස්තීන සටනට නවතමයන් පනපොවන ලද විශාල පිරිස් බලයකින් හා යුධ ශක්තියකින් හෙබි ඉරානයේ මැදිහත්වීම ද ලෝක සාමය දැඩි අර්බුදයකට ලක් කිරීමෙහි ලා නව මුහුණුවරකින් බලපෑම් එල්ල කර තිබේ. එබැවින් මෙම අර්බුධයෙන් ලෝක සාමයට, කලාපීය වශයෙන් හා ශ්‍රී ලංකාවට ආර්ථික, සාමාජීය හා සංස්කෘතික වශයෙන් ඇතිවිය හැකි බලපෑම සබැඳිව දැනුවත් වීම යුද්ධ හමුදා සාමාජිකයින් වශයෙන් අප හට ඉතාම වැදගත් වේ.

## ඉතිහාසය සැකෙවින්

මැද පෙරදිග රටවල් නිරූපණය කරන මෙම සිතියමේ රතු වර්ණයෙන් දක්වා ඇත්තේ මැද පෙරදිග එකම මුස්ලිම් නොවන රාජ්‍යය වන ඊශ්‍රාලයයි. වරෙක එක්තරා විශ්ලේෂකයකු ඊශ්‍රාලය දත් තිස් දෙක මැද ඇති දිව වැනි යැයි අර්ථ ගැන්වූයේ ඊශ්‍රාලය වටා තිබෙන සියලු රාජ්‍යයන් මුස්ලිම් ජාතීන් වෙසෙන රාජ්‍යයන් වීමත්, ඔවුනොවුන් අතර පවතින ශක්තිමත් සම්බන්ධතාවයන් මැද ඊශ්‍රායලය හුදකලාව යුදෙව් ජාතියක් ලෙස ඔවුන්ට විශාල අභියෝගයක් කරමින් අභීතව පැවත සිටීමයි. මෙහි දිනෙන් දින යුධ ගිනි ඇවිලෙන ප්‍රදේශ ලෙස පලස්තීනයේ පිහිටා ඇති ගාසා තීරය හැඳින්විය හැක.




ඊශ්‍රායල - පලස්තීන ගැටුම ගැඹුරු ඓතිහාසික, ආගමික සහ දේශපාලන මූලයන් සහිත දිගුකාලීන හා සංකීර්ණ ආරවුලකි. එහි දීර්ඝ ඉතිහාසය පහත ආකාරයෙන් ලඝු කොට දැක්විය හැකිය.

- **19 වන සියවසේ අගභාගය ආරම්භය දී සියොන්වාදය සහ අරාබි ජාතිකවාදය** 1800 ගණන්වල අගභාගයේ දී, එවකට ඔටෝමාන් අධිරාජ්‍යයේ කොටසක් වූ සහ බොහෝ දුරට අරාබිවරුන් විසින් ජනාකීර්ණ වූ පලස්තීනයේ යුදෙව් නිජබිමක් වෙනුවෙන් පෙනී සිටි යුදෙව් ජාතිකවාදය (සියොන්වාදය) මතු විය. ඒ අතරම, අරාබි ජාතිකත්වය වර්ධනය වෙමින් පැවති අතර, අරාබිවරුන් ස්වාධීනත්වය සහ ස්වකීය ආධිපත්‍යය අපේක්ෂා කළහ.

- **බ්‍රිතාන්‍ය ජනවරම (1917-1948) සමගම බැල්ෆෝර් ප්‍රකාශය (1917)** : පළමුවන ලෝක සංග්‍රාමයේදී බ්‍රිතාන්‍ය, පලස්තීනයේ "යුදෙව් ජනතාව සඳහා ජාතික නිවහනක්" සඳහා සහය පළ කරමින්, යුදෙව් නොවන ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ද පිළිගනිමින්, බැල්ෆෝර් ප්‍රකාශනය නිකුත් කළේය. මෙය කලාපයේ යුදෙව්වන් සහ අරාබිවරුන් අතර නොඉවසුම් ගතියක් ඇති කළේය. යුදෙව් සංක්‍රමණිකයින්ගේ රැල්ල පලස්තීනයට පැමිණියේ, විශේෂයෙන් 1930 සහ 1940 ගණන්වල, සමූල ඝාතන ඇතුළු යුරෝපීය යුදෙව් විරෝධීවාදයෙන් පලා යමිනි. මෙය අවතැන් වේ යැයි බියෙන් තම ඉඩම් අහිමි වේ යැයි බියෙන් සිටි අරාබි ජනතාවගේ වෛරය ක්‍රමයෙන් වැඩි විය.

- **එක්සත් ජාතීන්ගේ බෙදීමේ සැලැස්ම 1947** දී එක්සත් ජාතීන් විසින් පලස්තීනය වෙනම යුදෙව් සහ අරාබි රාජ්‍යයන් ලෙස බෙදා වෙන් කිරීමට යෝජනා කරන ලද අතර, ජෙරුසලම ජාත්‍යන්තර පරිපාලනයට ගෙන ඇත. යුදෙව් ප්‍රජාව මෙම සැලැස්ම පිළිගත් නමුත් අරාබි රාජ්‍යයන් සහ පලස්තීන නායකයින් එය ප්‍රතික්ෂේප කළ අතර, එය යුදෙව් සහ අරාබි ප්‍රජාවන් අතර ප්‍රචණ්ඩත්වය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

- 1948 වර්ෂයේදී අරාබි - ඊශ්‍රායෙල් යුද ගිනි ඇවිළුණු අතර, ඊශ්‍රාලයේ නිදහස් ප්‍රකාශය 1948 මැයි 14 දින ඊශ්‍රායල රාජ්‍යය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. අසල්වැසි අරාබි රාජ්‍යයන් (ඊජිප්තුව, ජෝර්දානය, ඉරාකය, සිරියාව සහ ලෙබනනය) වහා ඊශ්‍රායලය ආක්‍රමණය කළ නමුත් එයින් සාර්ථකව ආරක්ෂා වූ අතර, එක්සත් ජාතීන්ගේ යෝජිත දේශසීමාවෙන් ඔබ්බට තම භූමිය පුළුල් කළේය.

- ඉන් අනතුරුව 1964 වර්ෂයේදී ලොවම දන්නා සය දින යුද්ධය ඊශ්‍රායලය විසින් ඊජිප්තුව සිරියාව සහ ජෝර්දානයට එරෙහිව දියත් කර, එයින් ඊශ්‍රායලය විශිෂ්ට ජයග්‍රහණයක් ලැබුවා පමණක් නොව තම දේශ සීමාවන් ද තවදුරටත් පුළුල් කර ගැනීමට ඔවුන්ට හැකියාව ද ලැබිණ. තවද 1990, 1993, 2000 වර්ෂයන් සහ 2005 වර්ෂයේ දී නොයෙක් ආකාරයේ සාම සාකච්ඡා පැවතියද ඉන් එක් වතාවක දී හෝ සාර්ථක අවසානයකට ලගාවුයේ නැත.

- **ගාසා ගැටුම සහ හමාස් සංවිධානය**

2005 වර්ෂයේ දී ඊශ්‍රායලය ඒකපාර්ශ්විකව ගාසා තීරයෙන් ඉවත් වූ නමුත් වැඩි කල් යන්නට මත්තෙන් ඉස්ලාමීය සටන්කාමී කණ්ඩායමක් වන හමාස් එකී භූමියේ පාලනය සියතට නතු කර ගත්තේය. මෙය 2008, 2012, 2014 වර්ෂයන් තුල ක්‍රමයෙන් යුධ ගිනි ඇවිලෙමින් ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර, ගැටුම් නැවත නැවතත් පැනනැගුණු අතර, ගාසා තීරය මේ වනවිට ඊශ්‍රාලය සහ ඊජිප්තුව විසින් අවහිර කර ඇති අතර, එම තීරය දැඩිව මානුෂීය අවශ්‍යතාවයන් උවමනා කරන පැයෙන් පැය යුධ ගිනි ඇවිලෙන පොර පිටියක් බවට පත්ව ඇත.

## වර්තමාන තත්ත්වය

වර්තමානයේ ඊශ්‍රායලය ස්වයං පාලනයක් සහිත දේශයක් ලෙස ඉරානය, ලෙබනනය, පලස්තීනය, යේමනය සහ සිරියාව සමග තනිව සටන් කිරීමට තරම් ශක්තිමත් රාජ්‍යයක් වී ඇති අතර, කාලයාගේ ඇවෑමෙන් සංගව ගිය යුධ ගිනි නැවත දැල්වෙන්නට ආසන්නතම හේතුව වශයෙන් 2023 වර්ෂයේ ඔක්තෝබර් 27 වන දින හමාස් සටන්කාමීන් විසින් ඊශ්‍රායල පාලන බලප්‍රදේශයට පැමිණ පුද්ගලයින් 1400ක් පමණ ජීවිතක්ෂයට පත් කරමින් 220 අධික පිරිසක් ප්‍රාණ ඇපයට ගැනීම දැක්විය හැකිය. එම සිදුවීම සමග ඊශ්‍රායලය නැවත නැගී සිටින්නට වූයේ තම රාජ්‍යය කිසිවකුට දෙවැනි නොවන බැව් පසක් කරමිනි.

අද වනවිට ඊශ්‍රායලය හා පලස්තීනය අතර, පැවැති ගැටුම වටා ඇති සෑම රාජ්‍යයක් සමඟම යුද්ධයකට පෙරලී හමාරය. ඒ අතර ඊශ්‍රාලයට එරෙහිව නැගී සිටින බලවතා ලෙස ඉරාන රාජ්‍යය ප්‍රධාන තැනක් ගන්නා අතර, දෙරට අතර ප්‍රචණ්ඩත්වය වර්ධනය වී සටන දුරදිග ගියහොත් කිනම් රටකට වාසි සහගත වේ දැයි යුධ ශක්තිය සබැඳිව සංඛ්‍යාත්මක පිරික්සුමෙන් අප හට උපකල්පනය කළ හැකිය. කෙසේ වෙතත් එක් දෙයක් කිව හැකිය. යුද්ධය හේතුවෙන් දෙරටෙහිම ආර්ථික, සාමාජීය වශයෙන් දැඩි පසුබෑමකට ලක්වන බැව් නිසැකය.

### ඉරානය සහ ඊශ්‍රායලය

| හමුදා බලය | | |
|---|---|---|
| | ඉරානය | ඊශ්‍රායලය |
| ක්‍රියාකාරී හමුදා සාමාජිකයින් | 610,000 | 170,000 |
| සංචිත සටන් කරුවන් | 350,000 | 450,000 |
| හමුදා නොවන බලඇණි | 220,000 | 35,000 |
| එකතුව | 11,180,000 | 670,000 |

ඒ අනුව පෙනී යන්නේ ඉරාන යුධ ශක්තියට සාපේක්ෂව හරි අඩක පමණ ප්‍රමාණයක යුධ ශක්තියක් පමණක් ඊශ්‍රාලය සතු වුවත්, සෑම ඊශ්‍රායෙල් වැසියකුම අවුරුදු 02 ක් හෝ 03 ක කාලසීමාවක් හමුදා සේවයේ යෙදී ඇති බැවින්, යුධමය වාතාවරණයකදී ඊශ්‍රායෙල් වැසියන් කෙරෙහි එල්ලවන බලපෑම් සඳහා සජීවම මුහුණ දීමට පෙර සූදානමකින් පසුවන බවයි.

තවදුරටත් සංසංදනාත්මක විචාරයේ දී දෙරටෙහි යුධ වාහන ශක්තිය පහත පරිදි ගෙන දැක්විය හැක.

### ඉරානය සහ ඊශ්‍රායලය - සන්නාහ සන්නද්ධ රථ බලය

| සන්හා සන්නද්ධ රථ බලය | | |
|---|---|---|
| | ඉරානය | ඊශ්‍රායලය |
| යුද්ධ ටැංකි | 1996 | 1370 |
| යුද්ධ ටැංකි සන්නද්ධ රථ | 65,756 | 43,407 |
| ස්වයං විහිදුම් (Self Expansion) | 580 | 650 |
| ඇද විදින කාලතුවක්කු (Towed cannons) | 2050 | 300 |
| ජංගම රොකට් ප්‍රක්ෂේපන (Mobile Rocket Launchers) | 775 | 150 |

### ඉරානය සහ ඊශ්‍රායලය - නාවික ශක්තිය

| නාවික බලය | | |
|---|---|---|
| | ඉරානය | ඊශ්‍රායලය |
| යුද්ධ නෞකා | 101 | 67 |
| ආරක්ෂක නැව් | 7 | - |
| සබ්මැරීන | 17 | 5 |
| කාවට් වර්ගයේ නාවික යාත්‍රා) | 3 | 7 |
| මුර යාත්‍රා | 21 | 45 |

ඊශ්‍රායලය සහ ඉරානය අතර ගොඩබිමේ මුහුණට මුහුණලා යුධ වාතාවරණයක් ඇතිවීමට ඇති ඉඩකඩ අවම වන්නේ දෙරටේ දේශසීමාන්ට යාබදව ජෝර්දාන් හා ඉරාක රාජ්‍යයන් පිහිටා තිබීමයි. ඒ අනුව ගොඩබිමෙන් මෙන්ම මුහුදු සීමාවන්ගෙන් කිසිදු යුධ වාතාවරණයක් පැන නොනගිනු ඇතැයි විශ්ලේශකයින් පෙන්වා දෙන අතර, පහත ඉරාන සහ ඊශ්‍රායෙල් රාජ්‍යයන් දැක්වෙන සිතියමෙන් ඔබට ඒ බැව් මනා වැටහෙනු ඇත.




තවද, දෙරට අතර ගුවන් බලය යොදා ගනිමින් යුද්ධයක් නිර්මාණය වීමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් ඇති අතර, සංසන්දනාත්මක බැලීමේදී ඊශ්‍රායලය වෙත ප්‍රමුඛ තැනක් හිමිවනුයේ ඔවුන් සතු නවීන ගුවන් ප්‍රහාරක ශක්තිය නිසාවෙනි. ඒ අනුව ඔවුන්ගේ නවීන ප්‍රහාරක ගුවන් බළඇණි සංචිතයන් කිහිපයක් පැවතුණ ද ඒවායේ ප්‍රතිඵලදායී කාර්යක්ෂමතාවය පිලිබඳව සලකා බැලීමේදී ඉරානය සතුව පවතින යල්පැන ගිය ප්‍රහාරක යානා සමග ප්‍රහාර දියත් කිරීමට තරම් ප්‍රමාණවත් වෙතැයි විශ්ලේශකයින් පෙන්වා දෙයි. ඉරානය විසින් වර්තමානයේ ද භාවිතා කරනු ලබන්නේ ඉරාන පුනරුදයට පෙර එනම් වර්ෂ 1960 - 1970 කාලවකවානුව තුළ දී මිලදී ගත් ඒවා බැව් සඳහන් වේ. කෙසේ වුවද ඉරාන ගුවන් ශක්තියට වඩා කිහිප ගුණයකින් වැඩි ගුවන් ශක්තියක් ඊශ්‍රායලය සතු වුවත්, ඉරානය ස්වකීයව නිෂ්පාදනය කර ඇති ඩ්‍රෝන යානාවන්හි බලය ප්‍රබලය. එම ඩ්‍රෝන යානා අතර, සාහිට් 1, 36 කමිකසී (මරාගෙන මැරෙන ඩ්‍රෝනය) ප්‍රධාන තැනක් ගනී. ඒ අනුව දෙරටේ ගුවන් ශක්තිය සලකා බැලීමේ දී ඊශ්‍රායල ගුවන් බලයේ ගුණාත්මක බවත්, ඉරාන සතු ප්‍රමාණයත් අතර පවතින වෙනස කිසියම් හෝ මොහොතක ප්‍රචණ්ඩත්වයට සාක්ෂි දරනවා නොඅනුමානය.

### ඉරානය සහ ඊශ්‍රායලය - යුධ ගුවන් බලය

| යුධ ගුවන් බලය | | |
|---|---|---|
| | ඉරානය | ඊශ්‍රායලය |
| යුධ ගුවන් යානා | 186 | 241 |
| ආක්‍රමණික ගුවන් යානා | 23 | 39 |
| ආක්‍රමණික හෙලිකොප්ටර් | 13 | 48 |

දෙරට අතර ආර්ථික පසුබිම කෙරෙහි අවධානය යොමු කලහොත් ඉශ්‍රායලට පලමු තැන හිමිවන අතර, ඉශ්‍රායලය විසින් ඉරානයේ ආර්ථිකයට හා බලශක්තියට පහරදුනහොත් ඉරාන රාජ්‍යයට දරාගැනීමට නොහැකි තරමට බලපානු ඇතැයි බොහෝ දෙනාගේ මතනයි. තවත් කැපීපෙනෙන හේතු සාධකයක් වනුයේ මොනයම් හේතු සාධක මත ඉරානය නිවැරදි වුවත්, ලොව බලවතාගේ එනම් ඇමරිකානු සියලු සහායත් හිමිවන්නේ ඊශ්‍රායලට වීමයි. ඉරාන රාජ්‍යයට චීනයෙන් හෝ රුසියාවෙන් සහායක් නොලැබී ගියත්, ඊශ්‍රායලය වෙත ඇමරිකානු සම්පූර්ණ යුධ ශක්තිය වුවද ලබාදෙන බැව් දැනුම් දී ඇත.

කෙසේ හෝ දෙරට අතර යුධ සටන් වර්ධනය වී ප්‍රචන්ඩත්වයට පත් වුවහොත් එය නිසැකයෙන්ම තුන්වන ලෝක යුද්ධයේ ආරම්භය වනු ඇති බැව් විචාරකයින් මත පළකර ඇත.



මේජර් ඕපීකේඑම්ජේ වීරරත්න පීඑස්සී ශ්‍රීලපාහ
1 වන බළඇණිය - ශ්‍රී ලංකා පාබල හමුදාව



# "සෙට්වීමේ" සතුට හා "කට්වීමේ" ආදීනව

**ඒකාකාරී රාජකාරී ස්වභාවය තුළ සොල්දාදුවකු විසින් ලබන නිවාඩුව වූ කලී ඔහුගේ මහත් වූ උද්දාමයට හේතු වන්නකි. මක්නිසාද යත් රාජකාරියේදී තිබෙන්නා වූ බැඳීම් හා බලපෑම්වලින් තොරව, නිදහසේ තම හැඟීම් හා ක්‍රියාකාරකම් නිවාඩුව තුළදී ප්‍රකාශ කළහැකි නිසාය. නමුත් අවාසනාවකට සෙබළා නිවාඩුවේදී ලබන මේ අසීමිත නිදහස පෞද්ගලික ජීවිතය තුළ හැසිරවීමේදී විවිධ ගැටලු පැන නැගීමට හේතුවක් වී ඇත. ඒවා අතර, පවුල් ජීවිතයේ ප්‍රශ්න, ණයබර, රෝගාබාධ හා තම වෘත්තීයේ ගෞරවයට හානිවීම හුවා දැක්විය හැකිය. විශේෂයෙන්ම මෙහිලා මත්පැන් භාවිතය ආශ්‍රිතව පැන නගින ගැටලු සුලභ වේ.**

යහළුවන් සමග "සෙට්වීම" මත්පැන් හා එක්වීමක් ලෙස සිතීමට සමහර සොල්දාදුවන් පුරුදු වී ඇත. මෙහිදී "සෙට්වීමේ" අග්‍රඵලය "කට්වීම" දක්වා දිවේ. මිතුරන්ගේ නිවෙස්වලට ගිය විටද මිතුරන් තම නිවසට ආ විටද නිතැතින්ම සිදුවන "සෙට්වීම" තම නිවාඩුවේ අවස්ථා කිහිපයකදීම උදාකර ගැනීමට ඔවුහු උත්සාහ දරති. අලුත් අවුරුද්ද, නත්තල, උපන්දින සැමරීම, ගෙට ගෙවැදීම, වැඩිවියට පැමිණීම, විවාහ උත්සව ආදිය මෙසේ සෙට්වීමට අත්වැල් සපයන අතිකුත් ප්‍රධානතම හේතු සාධකයන්ය. මේ සියලු සෙට්වීම් අවසානයේ අසීමිත මත්පැන් පාවිච්චිය නිසා සිදුවන කට්වීම් තුලින් සමහරු තම ප්‍රතිරූපයට හානි කරගන්නවා පමණක් නොව තමාව අප්‍රිය කරන වටපිටාවක් ගොඩනගා ගැනීමක්ද සිදුකර ගනී. අවසානයේ මෙහි අයහපත් ප්‍රතිඵල තම බිරිඳට හා පවුලේ සාමාජිකයින්ටත්, පොදුවේ හමුදාවටත් අත්විඳීමට සිදුවේ.

සෙට්වීමේ සුභවාදී පැත්තක්ද ඇත. එනම් සුහද සතුටු සාමීචිය හා අලුත් හිත මිතුරන් හඳුනාගැනීම ආදිය වේ. එසේම එය මත්පැනින් තොර ප්‍රිය සම්භාෂණයක්ම විය යුතුය. නමුත්, සිදුවන්නේ අනෙකකි. කිසිඳු සෙට්වීමක් මත්පැනින් තොරව සිදුකළ නොහැකි බව සිතීමට පවා සමහරු පෙළඹී ඇත.

**සෙට්වීමේ සුභවාදී පැත්තක්ද ඇත. එනම් සුහද සතුටු සාමීචිය හා අලුත් හිත මිතුරන් හඳුනාගැනීම ආදිය වේ. එසේම එය මත්පැනින් තොර ප්‍රිය සම්භාෂණයක්ම විය යුතුය. නමුත්, සිදුවන්නේ අනෙකකි. කිසිඳු සෙට්වීමක් මත්පැනින් තොරව සිදුකළ නොහැකි බව සිතීමට පවා සමහරු පෙළඹී ඇත.**

ඉහත කරුණු දෙස සැළකිලිමත් වීමේදී කිසියම් අයහපත් කටයුත්තක් සීමාව ඉක්මවා කරගෙනයාම තමාට මෙන්ම අන් අයටද අවැඩක් මිස හොඳක් නොවන බව වටහාගැනීම වටී. එබැවින් මින් ඉදිරියට තමාගේ හා අන් අයගේ යහපත උදෙසාත් මුදල් පසුබිමේ සුරක්ෂිතභාවය උදෙසාත් සෙට්වීමෙන් කට්නොවී "සෙට්වීම කට්කිරීමට" කවුරුත් වගබලාගනු ඇතැයි සිතමි.

*ලුතිනන් කර්නල් සුජිත් චිමින්ද එදිරිසිංහ*



# මියගිය බව සිතූ කොටි සෙබළිය දැස් ඇරී

පසුගිය කළාපයේ ඉතිරි කොටස






■ ලුතිනන් කර්නල්
සුජිත්
චමින්ද
එදිරිසිංහ

දිවයන කෝප්‍රල් ජේමසිරිගේ *MPMG* අවියෙන් නිකුත් වෙන අඛණ්ඩ ප්‍රහාරය හමුවේ ඉදිරියේ වූ බංකරයේ සිටි ත්‍රස්තවාදීනට හිස එසවීමටවත් අවකාශයක් නොවුන්නේය. පතුරම් 200ක් යොදා සකස් කොට තිබූ එම පතුරම් වැලෙන් නිකුත් වූ සෑම උණ්ඩයක්ම නිසැකවම බංකරය විනිවිද යවන්නට ඔහු වගබලා ගත්තේ එම බර අවිය සෙල්ලම් බඩුවක් සේ හසුරුවමිනි. බංකරය සමීපයට වත්ම තම ප්‍රහාරයක වේගය වැඩි කළ ජේමසිරි පෙර සැලසුම් කළ පරිද්දෙන් වෙඩි තබමින්ම එහි වැලි කොට්ට ඇතිරූ වහලයට පැන්නේය. ඒ සමගම එතෙක් තම දෑතෙහි මිරිකාගෙන සිටි අත්බෝම්බ දෙක ද බංකරය තුළටම දමමින් සහායක සෙබළ තිලකරත්න ද සිය වගකීම අකුරටම ඉටුකළේය.

බංකරයේ වහලය උඩට පැනගත් කෝප්‍රල් ජේමසිරි දුටුවේ එතෙක් වේලා තමන් වෙත LMG අවියකින් අඛණ්ඩව ප්‍රහාර එල්ල කරමින් සිටි කොටි ත්‍රස්තවාදියකු එහි වැටී සිටින අයුරුය. ඒ වනවිට තවදුරටත් බංකරය තුළ අවදානම පහව ගොස් නොතිබූ හෙයින් එහි පැති කවුළුවෙන් තවත් අත්බෝම්බ දෙකක් ඇතුළට එල්ල කරන්නට ද සෙබළ තිලකරත්න ක්‍රියා කළේ කෝප්‍රල් ජේමසිරිගේ නියෝගයෙනි. අවසානයේ තත්පර ගණනක් තුළ සතුරු සමූහයකට එරෙහිව සිදුකළ අතිබිහිසුණු සටන නිමවූයේ සෙබළු දෙදෙනකුගේ හුදෙකලා වික්‍රමයක් ලෙසය. යුදබිම තුළ මුහුණට මුහුණ සිදුවන සටනක ජයග්‍රහණය හිමිවනුයේ පළමුව ඉස්සර වූ කෙනාටය. එම න්‍යායට අනුව එහි පැවති සටන ද නිමාවූයේ ජීවිතය වෙනුවෙන් අත්වැරදීම් ප්‍රමාද දෝෂවලට කිසිදු ඉඩක් නොමැති බව සනාථ කරමිනි. විශේෂයෙන්ම ඊට මොහොතකට පෙර විවෘත භූමියේ කොටු වූ ඔවුන් දෙදෙනා සතුරු අවි රැසකට මැදිව ජීවිත රැකගැනීම උදෙසා දැරූ අපමණ උත්සාහය නොවන්නට ඔවුන්ගේ ඉරණම මීට වඩා වෙනස් අයුරකින් විසඳෙනු නොඅනුමානය. එහිදී, කෝප්‍රල් ජේමසිරි හා සෙබළ තිලකරත්න ගත් ජීවිත අවදානම කොතෙක් ද යත් එය වූ කලී මරණය හඹාවිත් ජීවිතය සොයා ගැනීමක් විය.

බංකරය තුළ පැවති සටන අවසානයේ ත්‍රස්තවාදීන් දසදෙනකු මියගොස් ඇති බව එහි සිදුකළ පරීක්ෂා කිරීම්වලදී තහවුරු විය. එහිදී, කෝප්‍රල් ජේමසිරිගේ හා තිලකරත්නගේ පළමු කාර්ය වූයේ ත්‍රස්තවාදීන් සතුවූ අවි ආයුධ එකතු කිරීමය. ඒ සඳහා එම මළ සිරුරු එකිනෙක පරීක්ෂා කරන අතරේ තවත් සුවිශේෂී යමක් සිදුවිය. එනම්, මියගොස් සිටි ත්‍රස්තවාදීන් අතර

එක් සිරුරක කිසියම් වෙනස්වීමක් අහම්බෙන් මෙන් කෝප්‍රල් ජේමසිරිගේ නෙත ගැටීමය. එම අනපේක්ෂිත වෙනස්වීම දුටු වහාම ඔහු එම සිරුර පරීක්ෂා කරන්නට වූයේ දෙගිඩියාවෙන් යුතුවය. "මේ එකෙකුට පන තියෙනවා." ඒ සමඟම ඔහුට කෑගැසුණේ ඉබේටමය. මියගිය පිරිස අතර එක් ත්‍රස්තවාදියකු එලෙස ජීවතුන් අතර බැව් දැනගැනීමත් සමඟම සෙබළ තිලකරත්නගේ ගිනි අවිය වහා ඒ වෙත එල්ල විය. තවදුරටත් බංකරය තුළ අවදානමක් ඉතිරි කරලීමට ඔහු කිසිසේත් නොකැමැති වූයෙන් ඔහුගේ සුරතෙහි දබර ඇඟිල්ල සිය අවියේ ට්‍රිගරය වෙත යොමු වූයේ නිරායාසයෙනි. නමුත්, කෝප්‍රල් ජේමරත්න ඔහුට වඩා ඉක්මන් විය. හෙතෙම තිලකරත්නගේ අවියට පාපහරක් ද එල්ල කරමින් ඔහුගේ එම උත්සාහය වළකාලූයේය.

නමුත්, එතෙක් තමන්ව මරා දැමීමට උත්සහ කළ ත්‍රස්තවාදියකුට එලෙස නවත් අවස්ථාවක් ලබාදීම පිළිබඳව තිලකරත්න තුළ වූයේ නොසතුටකි. ඒ සමඟම තත්ත්වය තේරුම්ගත් කෝප්‍රල් ජේමසිරි ඔහුව අස්වසාලන්නට වූයේ ඔහුගේ පිටට තට්ටුවක් දමමිනි. "මුං අපිට කරදරයක් කළාට අපි ඉන්නෙ මුංව බේරගන්න, ඒක අපි කොයි වෙලාවකවත් අමතක කරන්න හොඳ නෑ" කෝප්‍රල් ජේමසිරිගේ එම වදන් තිලකරත්න තුළ ක්ෂණිකව ඇති කළේ විශාල මානසික පරිවර්තනයකි. අනතුරුව එම ත්‍රස්තවාදියා බේරාගැනීම පිණිස තම කෝප්‍රල්වරයා ගන්නා උත්සාහයට ඔහු ද සහාය වන්නට වූයේ නිරායාසයෙනි. එහිදී, ජේමසිරිගේ නියෝගයෙන් තිලකරත්න එම කොටි සාමාජිකයා පරීක්ෂා කිරීමේ දී දුටුවේ සිහිසුන්ව සිටිය ද අතක වූ සුළු තුවාලයක් හැරුණු විට ඔහුට බරපතල යමක් සිදුව නැති බවය. බාහිරින් නොපෙනුන ද එම කොටි සාමාජිකයාගේ සිරුර අභ්‍යන්තරයේ කිසියම් තුවාලයක් සිදුව ඇත්දැයි සැකහැර දැනගැනීමට කෝප්‍රල් ජේමසිරිට වුවමනා විය. ඒ අනුව තුවාලකරු ඇඳ සිටි LTTE කැලෑ ඇඳුමෙහි කමිසය ගලවා පරීක්ෂා කරන ලෙස හෙතෙම තිලකරත්නට දැනුම් දුන්නේය. එහිදී, ඔවුන් දුටුවේ පුදුම දනවන දසුනකි. එනම් තුවාලලත් කොටි සාමාජිකයාගේ කමිසයට යටින් තන පටයකි. එලෙස තුවාල ලැබ සිහිසුන්ව සිටියේ කොටි සාමාජිකාවක් බව ඔවුන් දැන ගත්තේ එවිටය. කොණ්ඩය කොටට කපා නිල



කර්නල් තිලංග රත්නසිංහ

ඇඳුම් හැඳ සිටි ඇය කාන්තාවක් බව බැලූ බැල්මට කිසිසේත් හඳුනාගත නොහැකිව තිබිණ.

කෙසේ හෝ වහ වහා ඇයව බංකරයෙන් පිටතට ඔසවාගෙන ආ ජේමසිරි තම සංග්‍රාමික මල්ලෙහි තිබූ වතුර බෝතලයෙන් ඇගේ මුවදොවා ඉන් ස්වල්පයක් බීමට ද සැලැස්සුවේය. ඉන් මොහොතකට පසු සිහිය ලද ඇ බියෙන් සලිත වූයේ යුද හමුදා සාමාජිකයන් තමා වටකොට සිටිනු දැකීමෙනි. ඇය තුළින් දිස්වූයේ බෙහෙවින් කලබලකාරී ස්වරූපයකි. එහිදී, ඇයව අස්වසාලූ ජේමසිරි ඇය හා කතා බහා කරන්නට යුහුසුළු විය. ඒ වනවිට ඔහුට යම් තරමක දෙමළ කතා කිරීමේ හැකියාවක් පැවතීම එම කටයුතුවලට විශාල පහසුවක් විය. ඒ වනවිට එතෙක් ඇ පැළඳ සිටි අත් ඔරලෝසුව තිබුණේ තිලකරත්න භාරයේය. ඕ වැඩිපුර විමසිලිමත් වන්නට වූයේ ඒ පිළිබඳවය. දිගින් දිගටම ඇ එම අත් ඔරලෝසුව

සොයන්නට වීම නිසා එහි සයිනයිඩ් සඟවා ඇත්දැයි තිලකරත්නට සැකයක් ද මතුවිය. කෙසේ වුව ඇ තුළ සිය දිවි නසාගැනීමේ උත්සහයක් පෙනෙන්නට නොවීය. විශේෂයෙන්ම යුද හමුදාව තමාගේ ජීවිතයට හානියක් නොකරනු ඇති බවට විශ්වාසයක් ඇ තුළ පැවති බව එහිදී සිදුකළ ප්‍රශ්න කිරීම්වලදී සනාථ විය. ඒ වනවිට එම කොටි සෙබළිය සිටි බංකරයේ තිබී යුද උපකරණවලට අමතරව ඌරු මස් හා පොල් රොටී, රුපියල් එකසිය පනහක මුදලක් හා පැනඩෝල් කාඩ් පතක් ද සොයා ගැනිණ. එසේම මෙම ත්‍රස්ත පිරිස එම බංකරයටම පැමිණ තිබුණේ ද පෙරදින සවස මන්නාරමේ සිට බව ද ඇ විසින් පවසා සිටියාය.

එලෙස එම පුවරසකුලම් ගම්මානය පිළිබඳව ද ප්‍රදේශයේ සෙසු බංකර් හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ආදිය පිළිබඳව ද සියලු තොරතුරු දැනගැනීමෙන් පසු එතෙක් ඇගේ ගැටගසා තිබූ දෙඅත් නිදහස් කරන්නට ද කටයුතු කෙරිණ. එසේම, පැනයාමට උත්සහ කිරීම මරණය අත්කරදීමක් බවට වූ තරවටුවක් ද ඇට ලැබුණු අතර එහිදී ඕ හමුදාවට බෙහෙවින් අවනත වූ සෙයක් ද පෙන්නුම් කළාය. ඒ වනවිට සහායක භට පිරිසක් ද එහි පැමිණ සිටි නමුත් ඔවුන් කිසිවකුටත් තවදුරටත් මැදිහත්වීමට තරම් සටනක් එහි ඉතුරුව නොතිබිණ. අවසානයේ එහි තිබූ මළ සිරුරු සහ අවි ආයුධ ඇතුළු යුද උපකරණ ඉවත් කරගෙන යාමේ කටයුත්තට ඔවුහු මැදිහත් වූහ. ඒ සමඟම එහි සිටි සෙබළකු නිවාඩු



සැරයන් තිලකරත්න ඩීඑන්ඩීස්



කෝප්‍රල් ජේමසිරි ඩීඑම්

ගොස් ගෙනැවිත් තිබූ වැලිතලප පාර්සලකයකින් කිහිපයක් ද එම කොටි සාමාජිකාවට ලබාදීමට ද කටයුතු කෙරිණ. ප්‍රදේශය පුරා අවදානම් වටපිටාවක් පැවති හෙයින් තුවාල ලත් සෙබළිය කඩිනමින් ආරක්ෂක ස්ථානයකට රැගෙන යාමේ අවශ්‍යතාවය මතුවිය. ඒ සඳහා සෙබළකුගේ කමිසයක් හා LTTE සාමාජිකයකුගේම සරමක් යොදාගෙන ලී දඬු දෙකක් ආධාරයෙන් සෑදූ ගිලන් ඇඳක තබා (Stretcher) ඇයව එහි සිට මීටර් 50 ක් පමණ ඔබ්බෙහි වූ ස්ථානයකට ඔසවාගෙන යාමට කටයුතු කෙරිණ. සෙබළ තිලකරත්න එම කටයුත්තට ද මූලිකත්වය ගත්තේය. එලෙස රැගෙන ගිය ඇයව විනාඩි 30 ක් පමණ ඇතුළත ගුවන් මගින් රෝහල කරා පිටත්කර හැරියාය.

ඉහත සිදුවීම ඒ වනවිට ගිනියම්ව තිබූ අවසන් මානුෂීය මෙහෙයුම තුළ තවත් එක් සිදුවීමක් ලෙස සටහන් වෙද්දී කෝප්‍රල් ජේමසිරි, සෙබළ ගුණතිලක සෙසු හට පිරිස් සමඟ මන්නාරමෙන් ඔබ්බට දියත් වූ එම දැවැන්ත ක්‍රියාන්විතය සමඟ පෙරට ඇදුනහ. මේ අතර තම ඒකක සෙබළකු මුල් වී සිදුකළ එම වික්‍රමය පිළිබඳ 16 විජයබාහු පාබල රෙජිමේන්තු අණදෙන නිලධාරී වූ මේජර් නිලන්ත රත්නසිංහ පසු වූයේ ආඩම්බරයෙනි. ත්‍රස්තවාදීන් 09 දෙනකු මරා දමමින් ගිනි අවි 10ක් හා ගුවන්විදුලි පණිවිඩ හුවමාරු යන්ත්‍ර 02ක් ද සමඟින් කොටි සාමාජිකාවක ජීවග්‍රහයෙන් අල්ලා ගැනීම වූ කලී ලෙහෙසි පහසු ක්‍රියාදාමයක් නොවන බව ඔහු දනී. නමුත් තම ඒකක සමාජිකයින්ගේ රණශූරත්වය හා කැපවීම පිළිබඳ අවබෝධයෙන් සිටි ඔහු කෝප්‍රල් ජේමසිරිගේ වික්‍රමය පිළිබඳ පුදුම නොවීය. විශේෂයෙන්ම තම ඒකකය ඇරඹූ තැන සිට එතෙක් දියත් වූ ක්‍රියාන්විතය තුළ විවිධ තැන්වල දී ඔහු එවැනි තීරණාත්මක කාර්යභාරයන් ඉටුකොට තිබීම ඊට හේතුවයි. කෙසේ වුව අර්සපුරකුලම් ඉදිරි ආරක්ෂක වළල්ලෙන් ඔබ්බෙහි එවර කෝප්‍රල් ජේමසිරි පෙන්වා තිබුණේ වීරත්වයට එහා ගිය අපූරු මිනිස්කමකි. ඒ අනුව 2008 දෙසැම්බර් 01 වන දින අණදෙන නිලධාරී සිය අත්සනින් යුතුව ඔහු වෙත ප්‍රශංසාත්මක ලිපියක් නිම්ගැන්වීමට කටයුතු කොට ඔහුට වීර පදක්කමක් සඳහා ද නිර්දේශ කිරීමට අමතක නොකළේය. සැබැවින්ම එය එම කෝප්‍රල්වරයාගේ අති විශිෂ්ට වීරත්වයට උපහාර පිදීමක් සේම ඔහු තුළ වූ උතුම් මිනිස්කමට ගෞරව කිරීමක් ලෙස අණදෙන නිලධාරියා සැලකුවේය.

මෙලෙස කාලය ගත වෙද්දී රට තුළ බොහෝ පරිවර්තනයන් සිදුවන්නට විය. විශේෂයෙන්ම 2009 වසරේදී යුද්ධයේ නිමාවත් සමඟම උතුරු ප්‍රදේශයේ ජන ජීවිතය ක්‍රමිකව සාමාන්‍ය අතට හැරෙද්දී ප්‍රදේශයේ සිදු කෙරෙන සංවර්ධන කටයුතු හරහා පරිසරයේ භෞතික වෙනස්කම් රැසක් ද සිදුවන්නට විය.

(නව කොටසක් ලබන කලාපයෙන්...)

# රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් දේශන මාලාවක්







යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් ගේ උපදෙස් හා මගපෙන්වීම මත රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් සංවිධානය කෙරෙන දේශන මාලාවේ තවත් අදියරක් ඉකුත් නොවැම්බර් මස 20 වන දින සෙසුනිලයින් 300 කගේ සහභාගීත්වයෙන් පැවැත්විණ. ඒ යටතේ 24 වන පාබල සේනාංකයේ සහ අම්පාර පුහුණු පාසලේදී එම දේශන පැවැත්විණ.

එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම් මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කිරීමත් යුද අත්දැකීම් සහිතවූවන් තුළ අභිමානයක් ඇතිකරලීමත් පිණිස "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" පිළිබඳ දේශනය ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් සිදුකරන ලදී. තවද, හමුදා සාමාජිකයින්ගේ සමාජමාධ්‍ය භාවිතය, ආර්ථික කළමනාකරණය, නීතිවිරෝධී ක්‍රියාවලට සම්බන්ධවීම ආදී කරුණු අලලා "අභිමානවත් සොල්දාදුවා" යන මැයෙන් වූ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු මේජර් එම්එච්එම්එස් බණ්ඩාර එල්එස්සී විසින් සිදුකරන ලදී.

# සෙබළ සිතුවිලි

## අම්මා...



බිහිවුණා දා මා ලෝකෙට
වින්ද දුකට අම්මේ
වේදනාව පසෙක දමා
හිනැහුනාද අම්මේ
මගේ ඇඬුම පළමු වරට
කණ වැටුණාම අම්මේ
සිරුරෙ තිබුණ ලේ ඔක්කොම
කිරි වුණාද අම්මේ
කල්ප ගණන් කතා කළත්
ඔබ ගැන මගෙ අම්මේ
නිම කරන්න බෑ ඔබෙ ගුණ
කියා මෙලෙස අම්මේ
මෙතේ බුදුන් දැක නිවනට
යනු මැන මගෙ අම්මේ

සෙ/629797
කෝප්‍රල් මදුසංඛ බීපී
1 ශ්‍රීලවියාඹ

## සෙබළ හදවත...

ගිණි අවිය අත දරන්
හිල ඇඳුම ඇන්දාට
හිල ඇඳුමින් සැඟවුණු හදවත
පෙනුමින් මනින්න ඉක්මන් වෙන්න එපා
මොකද
අපේ සංවේදී හදවත
ජීවිතයට නොපෙන් වන්නේ
යුතුකම් වගකීම් ඉටු කරන්නට
දිවුරා වුණු පොරොන්දුව නිසාය

සෙ/529451
ලා/කෝ බංඩුල ටීවීස්බී
142 පාබල බසේමු

## සිහින රාත්‍රිය...

මුමුණද්දී මිහිරි ගී
නොඇසුනිද නුඹ සවන්
ගොළු වූවෙ හද මඬල
සැඟවිද වළාවෙන්

පෙනෙන තුරු නුඹේ රුව
බැලුවේ මා දුර ඉඳන්
සැඟවිනිද සේයාව
ඉතිරිවිය මිරිඟුවක්

අතින්වත් නොඅල්ලන්
හද සෙනේ පිබිදෙද්දී
ගතින් ගත නොරැඳියන්
පැතු පැතුම් වියැකෙද්දී

නෙතින් නෙත දෙස බලන්
අඩ නින්දෙ ඇහැරෙද්දී
ඉතින් නුඹ හිනැහියන්
මගේ සිහිනේ මියැදෙද්දී

සෙ/පී100202
පුසෙ හේවගේ කේටී
612(143) පාබල බසේමු



## ආදරේ සුන්දරයි...

ගිලිහෙන්න එපා
ඔය දෑත් මගෙන්
තැවරුන ඔය මතක
හුස්මක් බරින් විඳුනත් ආදරෙයි
සදාකල් හදවතින් තුරුල් කරන්
නුඹේ පපුවට එළා
කී කතා මට තවමත් මතකයි
ඇස්වලින් දෙඩූ ඒ
ආදරේ සුන්දරයි

සෙ/ඩී101475
ලා/කෝ ධර්මසේන ඩීඩී
2(සෙව) ශ්‍රීලපාහ



## අභිමානවත් වූ 75...

බිහිකරනු වස් සුවැති විරුවන්
අනුමැතිය දී පැවති රජයෙන්
කොටස වෙන්කර රාජ්කියෙන්
හැත්තෑ පහකුත් විය එලෙසින්

වටෙක ගැරහුම් ඇනුම්පද සහ බැනුම්
තවත් තැන්වල සුහද පැසසුම්
කෙලෙස වුවත් රැවුම් ගෙරවුම්
තිබුණා සැම තැන සැමගෙ එකමුතුකම්

ක්‍රීඩාව ජයගෙන
ආගම මෙනෙහි කරගෙන
ළමයින් සතුටු කරමින
හැත්තෑ පහ නිමවිය එලෙසින

සැම සිත් සුවපත් වේවා
සැම හට සෙත සැලසේවා
යහපත ලොව රජවේවා
1 ශ්‍රීලයුවෙබ වැජඹේවා

කපිතන් (උපා) ඩීවීඑම් සමරකෝන්
උපකරණ පාලන නිලධාරී
1 ශ්‍රීලයුවෙබ



# මේ පහසුකම් සියල්ල ඔබටයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රාජකාරියේ නියුතු සහ විශ්‍රාමික යුද්ධ හමුදා නිලධාරී හා සෙසු නිලයින්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල අයවලුන්ගේ සුභසාධනය වෙනුවෙන් 1989 මැයි මස 23 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා සුභසාධක සංගමය පිහිටුවා ඇත. පසුව එය යුද්ධ හමුදාවේ ව්‍යාප්තිය සහ ඔවුන්ගේ සුභසාධක කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව සිදුකිරීමේ අරමුණින් මෙය යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය නමින් 1994 අප්‍රේල් මස 30 වන දින නැවත ආරම්භ කරන ලදී. මේ වනවිට සියලු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුභසාධනය උදෙසා විවිධ කටයුතු මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් දියත් කරනු ලබන අතර, ඉන් කිහිපයක් පහත සඳහන් පරිදිවේ.



යුද්ධ හමුදා සුබසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ
**බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්ජීබී විජේකෝන් යූඑස්පී එන්ඩීසී**

- ❑ යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා 5%ක අඩු පොලී අනුපාත යටතේ රු: 300,000.00 හා රු: 100,000.00 ක ණය මුදල් ලබාදීම.
- ❑ සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පහත දක්වා ඇති ස්ථානයන්හි පවත්වාගෙන යනු ලබන සුභසාධක වෙළඳසැල් මගින් විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ සහ ජංගම දුරකතන ලබාගැනීම සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් හට රු: 125,000.00 ක ණය මුදලක් ලබාදීම. (පනාගොඩ, මින්නේරිය, පල්ලේකැලේ, අම්පාර, දියතලාව, බූස්ස, අනුරාධපුරය)
- ❑ යුද්ධ හමුදා සාමාජිකයකු මියයාමේදී ඔහුගේ ළඟම ඥාතියා හට අවමඟුල් කටයුතු සිදුකිරීම සඳහා රු: 200,000.00 ක මුදලක් ලබාදීම වෙනුවෙන් යුද්ධ හමුදා මරණාධාර අරමුදල පවත්වාගෙන යෑම.
- ❑ යුද්ධ හමුදා සාමාජිකයින් හට තම නිවස ඉදිකිරීම / අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය විශේෂිත වට්ටම් මුදලකට ලබාගැනීම සඳහා ලිපි ලබාදීම.
- ❑ විශ්‍රාම / මියගිය හා සක්‍රිය සේවයේ යෙදී සිටින යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් රජයේ පාසල්වල පළමු ශ්‍රේණියට හා ආරක්ෂක සේවා විද්‍යාලයන්හි පළමු ශ්‍රේණිය වෙත ඇතුලත් කිරීම සහ අනෙකුත් ශ්‍රේණීන් සඳහා ඇතුළත් කිරීම වෙනුවෙන් ප්‍රමුඛතා ලිපි ලබාදීම.
- ❑ රාජ්‍ය සේවයේ නියුතු තම කාලත්‍රයා හට ස්ථාන මාරුවීම් ලබාගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිපි ඉදිරිපත් කිරීම හා නිවසට අවශ්‍ය විදුලිය/ ජලය ප්‍රමුඛත්වය මත ලබාගැනීම සඳහා ප්‍රමුඛතා ලිපි ලබා දීම.







- ❑ යුද්ධ හමුදාවේ සියලු ස්ථාන වෙත පුවත්පත් ලබාගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්කර දීම, යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුහසාධනය උදෙසා කැරම් බෝඩ්/දාම් බෝඩ්/ඩාඩ් බෝඩ්/ඇක්ටිව් ස්පීකර්ස් වැනි සුහසාධක භාණ්ඩ ලබාදීම.

- ❑ සේවයේ නියුතු නිලධාරී/සෙසුනිලයින් සහ විශ්‍රාමික නිලධාරී/සෙසුනිලයින් හට පහත දක්වා ඇති සහනදායි මිල ගණන් යටතේ කතරගම නිවාඩු නිකේතනය වෙතින් නවාතැන් පහසුකම් ලබාදීම.

| නිලය | කාමර ප්‍රමාණය | කාමරයක ගාස්තුව (රු) |
|---|---|---|
| මේජර් ජෙනරාල්/බ්‍රිගේඩියර් | 03 | 1000.00 |
| කර්නල්/ලුතිනන් කර්නල් | 06 | 800.00 |
| මේජර් සිට 2/ලුතිනන් | 09 | 600.00 |
| බලලත් නිලධාරී | 05 | 600.00 |
| මා/සැරයන්/සැරයන් | 06 | 400.00 |
| කෝප්‍රල් සිට සාසෙ දක්වා | 10 | 400.00 |
| සිවිල් සේවකයින් | 02 | 400.00 |





- ❑ යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා වාර්ෂිකව මුද්‍රලට / නොමිලේ දිනපොත් සහ දින දර්ශන ලබාදීම.

- ❑ විදේශ පාඨමාලා, සම්මන්ත්‍රණ සහ ක්‍රීඩා කටයුතු සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් විදේශ රක්ෂණාවරණය ලබාදීම.

- ❑ සියලුම නිලධාරී / සෙසුනිලයින් හට සුහසාධක සාමාජිකත්වය ලබාදීම සඳහා අයකරනු ලබන රු: 1,000.00 ක සාමාජික මුදල මහු විශ්‍රාම / අස්ව යාමේදී එහි ලාභාංශය සමඟ ලබාදීම.

- ❑ නීත්‍යානුකූලව යුද්ධ හමුදා රාජකාරී ඉටුකිරීමේ දී, සිවිල් අධිකරණයන්හි නඩු පැවරීමට භාජනය වන අවස්ථාවකදී සියලු නිලධාරී / සෙසුනිලයින් සඳහා රු. 100,000.00 ක නිති ආධාර මුදලක් ලබාදීම.

- ❑ යුද්ධ හමුදා සාමාජිකයින් ඇතුළු සියලුම අයවලුන් හට කුලී පදනම මත එක් කිලෝ මීටරයක් සඳහා වන අවම මිල ගණන් යටතේ ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා පහත දක්වා ඇති ස්ථානයන්හි සුඛෝපභෝගී / අධි සුඛෝපභෝගී සුහසාධක බස්රථ ස්ථානගත කර ඇත.





සුසාවෙසැ පනාගොඩ (රෙම ශ්‍රීලංලු) - බස්රථ 03
සුසාවෙසැ පල්ලේකැලේ (11 සේමු ) - බස්රථ 01
සුසාවෙසැ දියතලාව (1 ගැහේබ) - බස් රථ 01

යුහ සාමාජිකයා හට - රු: 135.00
ලගම ඥාතින් හට - රු: 145.00
සිවිල් පුද්ගලයින් හට - රු: 160.00





- ❑ යුහ රථ වාහන රිය අනතුරකදී ඇතිවන දේපල හානි, ජීවිත හානි සහ තුවාල වෙනුවෙන් හානි පූර්ණය කර ගැනීම සඳහා රථ වාහන රක්ෂණය පවත්වාගෙන යාම.

- ❑ යුද්ධ හමුදා රියදුරන් මගින් සිදුවන අනතුරකදී ඔවුන් හට දැරීමට සිදුවන මූල්‍යමය පාඩුව අවම කිරීම සඳහා සාමාජිකත්වය ලබා ඇති අයවලුන් හට රු.300,000.00 ක මුදලක් රියදුරු සහන අරමුදල වෙතින් ලබාදීම.

- ❑ සක්‍රිය/විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල අයවලුන් සඳහා පහත දක්වා ඇති ප්‍රතිලාභ ඇතුලත්ව සෞඛ්‍ය/ජීවිත රක්ෂණාවරණයක් ලබාදීම සඳහා සුවසහන අරමුදල පවත්වාගෙන යෑම.

| ප්‍රතිලාභය | මුදල රු: |
|---|---|
| සාමාජිකයා | |
| සාමාජික මරණ සඳහා | 1,000,000.00 |
| පූර්ණ කාලීන අර්ධ අබාධිත (ආබාධිත ප්‍රතිශතය අනුව) | 1,000,000.00 |
| බරපතල රෝග ආවරණය | 1,500,000.00 |
| කාලත්‍රයා | |
| මරණ | 500,000.00 |
| බරපතල රෝග ආවරණය | 1,500,000.00 |
| දරුවන් | |
| මරණ | 50,000.00 |
| බරපතල රෝග ආවරණය | 1,500,000.00 |
| දරු උපත් සඳහා | 25,000.00 |
| පවුල් ඒකකයක් සඳහා වසරකට සෞඛ්‍ය සහ රෝහල් ප්‍රතිලාභ | |
| රෝහල්ගත කිරීම් සාමාන්‍ය - | 200,000.00 |
| රෝහල්ගත කිරීම් - සැත්කම් | 300,000.00 |
| අවිවාහක අයවළුන්ගේ දෙමාපියන් සඳහා බරපතල රෝග ආවරණය (ජීවිත කාලයටම) | |
| මව/පියා | 1,500,000.00 |

- යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් සඳහා දිවයිනේ ඕනෑම ප්‍රදේශයකින් රජයේ පාසලක් හෝ කොළඹ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාල වෙත ඇතුලත් වීමට අවස්ථාවක් ලබාදීම.











සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් යුද්ධ හමුදා නිලධාරී හා සෙසුනිලයින්ට හිමි විය යුතු සුභසාධක පහසුකම් විධිමත්ව සහ ක්‍රමවත්ව ඉදිරියටත් සිදුකිරීම සඳහා එහි අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලය පූර්ණ ලෙස ඇපකැපව සිටින බව ඉතා සතුටින් දන්වා සිටින අතර, ඔබගේ සුභසාධක කටයුතු සහ ගැටලු සඳහා පහත දුරකථන අංක භාවිතා කරන්න.

**විමසීම්**

**සුසාඅම ප්‍රධාන කර්යාලය**
0112 514956, 076 9923164

**සුවසහන අරමුදල**
071 3158572, 076 6367512, 070 2691666, 070 3158510

**පාසල් අංශය**
074 0320416

**රක්ෂණ අංශය**
076 4512088

**සුභසාධන බජරට අංශය**
077 7158572



# කාන්තාවකගේ සැබෑ යථාර්ථය කලා ඥාණයෙන් පිළිබිඹු වේද?

ලෝකයේ වෙසෙන ජනගහනයෙන් හරි අඩක්ම කාන්තාවන් බව අවිවාදයෙන් පිළිගත යුතුය. කාන්තාව පිළිබඳ සම්ප්‍රදායික චින්තනය වූයේ උපතින්ම පහත් බුද්ධි මට්ටමකින් යුතු කොටසක් ලෙස සැලකීමයි. ඒ අනුසාරයෙන් ඇයට අත්වූ ඉරණම වූයේ ඇ ගේ දොර වැඩකටයුතුවලට පමණක් සීමා වූ තැනැත්තියක් වීමයි. එහෙයින්ම ඇගේ බුද්ධිය විද්වතුන් විසින් හැඳි මිටට පමණක් සීමා කරන ලදී. එහෙත් විටෙක එකී කාන්තාවම ලොව සියලු සෞන්දර්යවාදීන්ට එකම නිර්මාණ උල්පතක් විය. පුරාතන මෙන්ම නූතන කලාකරුවන් ද ඔවුන් නියැලී සිටින මාධ්‍යයන්ට කාන්තාව නිතැතින්ම ඇතුලත් කරගනු ලැබුවාය. ඒ හේතුවෙන් එම කලාකෘතීන්ට අපූර්වතම ප්‍රබෝධයක්, අලංකාරයක් ලැබුණි.

සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වන කෝට්ටේ යුගයේදී රචනා වූ සාහිත්‍ය කෘතීන්හි කාන්තා වර්ණනාවට ප්‍රමුඛස්ථානයක් දී තිබෙනු දැකගත හැකිය. සැබැවින්ම ඒ වර්ණනා තුලින් හා ඊට යොදාගත් උපමාවන් නිසාම එම සාහිත්‍ය කෘතීන්ට අමුතු ආලෝකයක් ලැබී තිබේ. එකී යුගයේ නිර්මාණය වූ "ගුත්තිල කාව්‍ය" සඳහා ස්ත්‍රී වර්ණනාවක් ඉදිරිපත් කිරීමට වෑත්තෑවේ හිමියන් ගත් උත්සාහය මේ තුලින් පිළිබිඹු වේ.

පිපි සමන් කුසුමන් පටින් තන රන් හසුන් මත්මෙන්     බැඳේ
ලඹ සවන් දිගු රන් පසින් දුන නෙත් මුවන් බඳිමින්     තැදේ
මඳ පවන් වැද ලෙල පහන්සිළු මෙන් රැඟුම් දෙන රන්     බඳේ
දිලිඹුවුන් රූ සිරි නුවන් වන් බඹ උවන් දැහැනින්     මිදේ

(ගුත්තිලය)

ජන කවිය කාන්තාව දුටුවේ මීට වඩා හාත්පසින්ම වෙනස් වූ ස්වරූපයකිනි. එදිනෙදා නෙත ගැටෙන ගහකොළ, දියඇලි, මල් ඔස්සේ කාන්තා රූ සපුව දුටු ජනකවියා ස්වකීය සිත්හි මැවුණු චිත්තරූපය කවියට නැගුවේ මෙසේය.

දුර    එනකොට වැටකෙයියා මලක්    වගෙයි
ලඟ    එනකොට රිදීයෙන් කල වැඩක්    වගෙයි
ගෙට    එනකොට ගෙයි ඇවිලෙන පහන    වගෙයි
මගේ    මැණිකේ මට මහනෙල් මලක්    වගෙයි

ඇතැම් කවියන් තරමක අතිශයෝක්ත වර්ණනාවකින් කාන්තා රූපශ්‍රීය වර්ණනා කරන්නට ඉදිරිපත් වූ අයුරු සැළලිහිණි සංදේශයේ දී හමුවේ.

සිසිවන උවන ඉඟ සුග ගත හැකි මිරිත
තිසි පුළුලුකුල රිය සක යුරු තිසර තත
දිසි රණලියෙව් රූ සිරි යුත් මෙපුරගත
ඇසිපිය හෙළන පමණින් නොවෙති දෙවඟන

(සැළලිහිණිය)

මේ කවි කියවද්දී නිතැතින්ම අපට සිහිපත් වන්නේ සුප්‍රකට චිත්‍ර ශිල්පියකු වූ ජෝර්ජ් කීට්ගේ විහාර සිතුවම්ය. කරුණා රසයටත්, ශෘංගාරාත්මක රසයටත් විවිධ නිර්මාණ ඔස්සේ සම්මාදම් වූ කාන්තාව ලෝ පරසිඳු චිත්‍ර ශිල්පීන්ගේ තෙලිතුඩට හසුවූයේ "මොනාලිසා" බඳු සියුම් සිතුවම් තුළිනි.

දිවි පැවැත්මේ කර්කශ වෙහෙසත් ඒ නිසාම හිත පෙළෙන සරතැසත් ජීවිතය පිළිබඳ සංකල්පනාත් එකට කැටිකොට ගෙන ගැමි සොබා සෞන්දර්ය මවා පෑ මහගු ආශ්චර්ය වස්තුව වූයේ කාන්තාවම නොවේදැයි මේ කවියෙන් පැහැදිලි වේ.

රන් එළියට හැන්දෑවේ මුදු කොහෙ දිලිසෙන්නේ
රන් ගෝමර පෙති ඉහිලා ලමැද බබුළුවන්නේ
රන්වන් වී කරලක් මෙන් හිමට නැමී ඉන්නේ
රන් එතනා ඉපනැල්ලේ මොනවද අවුලන්නේ
තුඹේ කැකිරි සිනා පොදක් මා වෙත හෙළමින්නේ
හිතේ තියෙන දුක මඳකට දුරු කරවාපන්නේ

(නව කවිසරණිය) සේකර

බොහෝ කලා කෘතීන්ට ස්ත්‍රී වර්ණනාව අවශ්‍යයෙන්ම එක් කරන ලද අංගයකි. සැබැවින්ම නිර්මාණයක රසඥතාවය තීව්‍ර කිරීමට එය හේතු සාධක වූයේය. නිදසුනක් වශයෙන් ස්වභාව සෞන්දර්ය පිළිබඳ වර්ණනාවක් විග්‍රහකර බලමු. මේ තුළින් පවා අපේ කලාකරුවන් නිර්මාණය කිරීමට උත්සාහ ගත්තේ කාන්තාවකගේ විචිත්‍ර නිර්මාණශීලී ස්වභාවය පරිසරයට කෙතරම් සාධනීය වී ඇති ද යන්නය.

කුරුල්ලන්ට ගී ගයන්න ඔබ කටහඬ දෙන්න
නෙලුම් විලේ මල් පිපෙන්න ඔබ දෙකොපුල් දෙන්න
මැණික්වලට දීප්ත දෙන්න ඇසේ කැලුම් දෙන්න
තාදල්ලට පාට වෙන්න ඔබේ තොල්පෙති දෙන්න
දේදුන්නට හැඩය ගන්න දිග නෙත් බැමි දෙන්න
ඉරට හඳට එළිය දෙන්න මුවහසකැන් දෙන්න (වික්ටර්)

මෙකී සෞන්දර්යාත්මක බවම ප්‍රේමයේ අති සියුම් භාවප්‍රකාශනය කාන්තා ගතේ නාරි කෝමලත්වය වැළඳගත් කල පුරුෂකායෙන් ද්වනිත වන්නේ ආසන්නතම අර්ථය වන ශෘංගාරය ද බොහෝ විට ඇතැම් නිර්මාණකරුවන් එය එසේ යැයි සාක්ෂාත් කිරීමට උත්සාහ දැරුවද සැබැවින්ම ඒ තුළින් නිර්මිත වනුයේ භාවාත්මක ප්‍රේමයක අති සියුම් මුද්‍රාව නොවේදැයි "සීගිරි බිතු සිතුවම්", "රාමසීතා" පුවත "රාධා ක්‍රිෂ්ණා මූර්තිය" මෙන්ම මේ නිර්මාණයද සාක්ෂි දරනු ඇත.

කුමරියන පා සළඹ සැලුනා
වසා සිරි නෙතු පියන් ඇරුනා
කුමර වඹසර අසපුවේ මා
සමවැදී උන් දහැන් බිඳුනා..

උකුල ලැමහස මලවී කරලිය
මුවා කල ඇගේ දුහුල් සළුනිර
විවර කෙරුවා මනස් සලෙලුන්
උමතු වූ දෙනුවන් රැගෙන් අද
මා අභියස මැවුනු තුසිතය
සුරන් නැළැවූ සුයාමය..

(අමරදේව)

**නවකතාකරුවන්, කෙටිකතාකරුවන්, නර්තන ශිල්පීන්, මූර්ති ශිල්පීන්, චිත්‍ර ශිල්පීන් ආදී මෙකී නොකී සියලුම කලාකරුවන් මෙතෙක් කාලයක් පුරාවටම ස්වකීය නිර්මාණයන් සඳහා වස්තු විෂයය කරගත්තේ කාන්තාවගේ බාහිර සුකොමල ලාලිත්‍ය වර්ණාව පමණි. ගැමි සංස්කෘතිය තුළදී සංයම රූපකායන්ට යොමු වූ කාන්තා නාරි දේහය වර්තමානයේ උන්මාද වූ උපමාවන්ට මුසුකර එකී උන්මාදයෙන් උන්මන්තක වූ කාන්තාවන් සමාජීය ආතුරයන් කර ඒ තුළින් සමාජයේ ගරු නම්බුනාමයන්ට පාත්‍රවන්නට තරම් සැහැසි වූ කලාකරුවන්ට කාන්තාවකගේ සැබෑ සමාජ ඉරණම අව්‍යාජ නිර්මාණයකට මුසුකළ නොහැක්කේ මන්ද.**



මේ වූ කලී නිර්මාණ ලෝකයේ ජීවත්වන්නා වූද, කලාකරුවන්ගේ චිත්තරූපයන්ට පණ පෙව්වාවූද මනෝමූලික කාන්තාවය. මෙතෙක් කාලයක් පුරාවටම හැම කලාකරුවකුම කාන්තාවගේ රුවගුණ වැනුවා මිසක ඇගේ ළඳබොළඳ බව ආයුධයක් කොටගෙන ජීවිත ජීවත් කරවූවා මිසක ඇගේ සමාජීය කාර්යභාරය අගය කළෙහිද? ඇයට සමාජයෙන් එල්ල වූ අසාධාරණකම් පීඩාවන් වෙනුවෙන් ස්වකීය නිර්මාණයන් කලඑළි දැක්වූයෙහිද සැබැවින්ම කිව හැක්කේ නැත යනුවෙනි. ඕනෑම කලා කෘතියක කාන්තාව දැඩිව මෙන්ම සියුම්ව හසුකරගත් භූමිකා දැකිය හැකිය. එකී කලා කෘතීන්හි සාර්ථකත්වය පිටුපස මෙකී කාන්තා කෝමලත්වය විචිත්‍රවත්ව නිර්මාණය කිරීම තුළින් එම නිර්මාණයන්ට යම් සුවිශේෂත්වයක් හිමිකරදීමට කලාකරුවන් උත්සාහ ගනිද්දී අසාධාරණ ලෙස ඒ සෞන්දර්යය ප්‍රවාහයට කාන්තාව ගොදුරු කරගන්නා අයුරු ද දැකගත හැකිවේ.


නවකතාකරුවන්, කෙටිකතාකරුවන්, නර්තන ශිල්පීන්, මූර්ති ශිල්පීන්, චිත්‍ර ශිල්පීන් ආදී මෙකී නොකී සියලුම කලාකරුවන් මෙතෙක් කාලයක් පුරාවටම ස්වකීය නිර්මාණයන් සඳහා වස්තු විෂයය කරගත්තේ කාන්තාවගේ බාහිර සුකොමල ලාලිත්‍ය වර්ණනාව පමණි. ගැමි සංස්කෘතිය තුළදී සංයම රූපකායන්ට යොමු වූ කාන්තා නාරි දේහය වර්තමානයේ උන්මාද වූ උපමාවන්ට මුසුකර එකී උන්මාදයෙන් උන්මන්තක වූ කාන්තාවන් සමාජීය ආතුරයන් කර ඒ තුළින් සමාජයේ ගරු නම්බුනාමයන්ට පාත්‍රවන්නට තරම් සැහැසි වූ කලාකරුවන්ට කාන්තාවකගේ සැබෑ සමාජ ඉරණම අව්‍යාජ නිර්මාණයකට මුසුකළ නොහැක්කේ මන්ද.













ඇතැම් නිර්මාණයන් තුළින් ගැහැණියකගේ දුබල බව ඇය ගොදුරු වූ ඇතැම් සමාජ ප්‍රවාහයන් නින්දිත ලෙස අතිශෝක්තියෙන් යුතුව ගෙනහැර දැක්වුවා මිසක ඉන් එහා යමක් සිදුවූයේ නැත. නවකතාවක්, ගීතයක්, සිනමා කෘතියක්, ටෙලි නාට්‍යයක්, චිත්‍රයක් තුළින් පවා දිස්වනුයේ පුරුෂාධිපත්‍යයට යටත් වූ ගැහැණියකගේ ස්වයංස්වරය පමණි. පවුල වෙනුවෙන් සමාජය වෙනුවෙන් රට වෙනුවෙන් ඇය හෙලන කඳුලු, සුසුම්, නින්දා, ප්‍රශංසා ගැන නිර්මාණයක් බිහිකරන්නට අප මන්දගාමීවනුයේ ඇයි. එහෙත් කලාව දඩමීමා කරගත් ඇතැම් කලාකරුවන් ප්‍රබුද්ධ යැයි සම්මත කාන්තාවන් කොටසක් ගෙන මෙකී කරුණු ඔවුන් හා සම්බන්ධ කර වර්ණනා කළ වාර නැතිවාම නොවේ. එහෙත් මෙහිදී වැදගත් වනුයේ "ප්‍රබුද්ධ හෝ පීචං" බව නොවේ. ගැහැණියකගේ සමාජ ස්ථාවරත්වය කෙබඳුද යන්න පොදුවේ නිර්මාණය කිරීම පමණකි. මේ කවිය ඊට කදිම නිදසුනකි.

පියකරු මල් ඉපිදු නොපෙනෙන තැනක නසී
මල් නොම ලැබෙයි සමහර ගස්වලට රිසී
කුණුවන විටෙක පොළොවෙහි ඇති පසට වැසී
මානෙල් මීහිමල් වෙනසක් නොගෙන සකී

කලාකරුවන් අතර සිටින අතලොස්සක් වූ කාන්තා කලාකාරිනියන් පවා ස්වකීය පෞරුෂයට අත් වී ඇති ඉරණම පිළිබඳව නොදන්නියන් සේ පසුවීම ද පුදුමයකි. තමන්ට සිදුවෙමින් පවත්නා ව්‍යසනය දැක දැකත් ඔවුන්ගේ පන්හිඳ, තෙලිතුඩ, කාය ශක්තිය තම තවත් නැඹුරු වනුයේ ස්වභාව සෞන්දර්යය, ප්‍රේමය, ප්‍රශස්ති ගායනා ආදිය මවන්නට පමණි. මින් එහා යමක් ඔවුනට කළ හැකිවා නොවේද? ඒ අතින් බලන කල පාකිස්ථානයේ තස්ලිමා නස්රීන්, ඉන්දියාවේ සරෝජනී, නායිඩු, ශාරාත්ජින් වැනි කලාකාරියන් අගේකළ යුතුය.

බොහෝ කලාකරුවන් ස්වකීය නිර්මාණ කෙත පුරා වපුරනුයේ ප්‍රේමයේ බීජු ඇට පමණි. ඊට දිය සපයන දිය කඩිත්ත වූ කලී කාන්තාවය. කලාකරුවා ස්වකීය දෘෂ්ටිපථයට හසුකර ගනුයේ ඒ දිය කඩිත්තේ දිග, පළල හා හැඩහලය පමණි. මෙකී ප්‍රේමයේ පීඩාවට පත් කාන්තාවන්ගේ ළසෝගිණි දැල්වල වේදනාත්මක බව ලංකාවේ සිදුවන කාන්තා සියදිවි නසාගැනීම්වල ප්‍රතිශතය දිනෙන් දින සීඝ්‍ර කරගත් ඒ කටුක පුරාවෘත්තීය සිතුවම් කරන්නට කලාකරුවන් ඉදිරිපත් වූ මොහොතක් දක්නට නැති තරම්ය.

ඕනෑම කලා කෘතියකට මිනිස් සිතට සම්පවීමේ ගුප්ත බලයක් ඇත. එකී ගුප්ත බලය සාර්ථකව මිනිස් සිතට එන්නත් කිරීමේ සියුම් ශෛල්‍යකර්මය කළහැකි ශාඛ්‍යතාවයක් සැබෑ කලාකරුවා සතුව නිසගයෙන්ම පවතී. ජනමාධ්‍යයන්හි හොරණෑ හඬට වඩා යම් පණිවුඩයක් සමාජය වෙත ගෙනයෑමට කලාකරුවා සතුව පවත්නා ඒ හැකියාවට ඔවුන් පණ පොවන්නේ මූල්‍යමය ප්‍රගතියක් ඇත්නම් පමණක් යන තත්ත්වයට අද කලාකරුවා පත්ව ඇත. ඒ අතින් ඉන්දියාවේ සත්‍යජිත් රායි, අදූර් ගෝපාල්, ක්‍රිෂ්ණන්, ආර්කේ නාරායන්, ජපන් සිනමාකරු අකිරා කුරසෝවා වැනි කලාකරුවන් අගේකළ යුතුය. මන්දයත්, ස්වකීය සංස්කෘතික ප්‍රවාහය යටතේ කාන්තාවට සමාජයෙන් එල්ල වූ නින්දිත අසාධාරණයන්ට එරෙහිව තමන් නිරතව සිටින කලා මධ්‍යයන් තුළින් ඔවුන් ඔවුන්ට හැකි පමණින් හඬක් නැගීය. මුළු ලොවම ඔවුන්ව අදත් හඳුනන්නේ එබැවිනි. මුළු ලෝකයේම ගෞරව සම්මාන, පුද සත්කාරයන්ට ඔවුන් පාත්‍ර වන්නේ ද එබැවිනි. අපේ කලාකරුවන්ට එවැනි යමක් කළ නොහැක්කේ මන්ද? අපේ සංස්කෘතික උරුමයන් සුරකිමින් සුලභ වාණිජ රැල්ලෙන් හා ආත්මලාභී ප්‍රචාරක රැහැනින් මිදී සමාජීය සත්‍ය සුභාවිත රසාස්වාදයකින් නිර්මාණය කරන්නට දැනුදු අපේ කලාකරුවන් ප්‍රමාද වියයුතු නැත.

ධනේශ්වර ක්‍රමයේ සුරක්‍ෂිතභාවය සඳහා වඳ වූ සිතුවිලිවලින් යුත් කාන්තා පරපුරක් බිහිකිරීමට සියලුම කලාකරුවන් විසින් කරනු ලැබූ නිර්මාණාත්මක සංස්කෘතියෙහි ප්‍රතිඵල භුක්ති විඳ අවසානය ඛේදවාචකයක් කරගත් සමස්ත කාන්තා පරපුර වෙනුවෙන් යමක් කරන්නට ඒ කලාකරුවන්ට නොහැකි මන්දැයි ප්‍රහේලිකාවකි. කලාකරුවන් විසින්ම සිතුවම් කළ මේ නායගිය කාන්තා සංස්කෘතික ප්‍රවාහය යළිත් පිළිසකර කළ හැක්කේ එකී කලාකරුවන්ටම බව හඬනගා කියමු.

*චිරාණි කෝකිලා ද සිල්වා විසින් රචිත "ආශ්වන්න" කෘතිය ඇසුරිනි.*



# දුටුගැමුණු රජුගේ මියයෑම
# කෙසේ සිදුවීද?

දුටුගැමුණු රජුගේ මිය යාමට හේතුව පිළිබඳ නිශ්චිත තොරතුරක් නොමැති වීම ඉතිහාසය පිළිබඳව උනන්දුවක් දක්වන බොහෝ දෙනකුට පවතින ගැටලුවකි. මහාවංශයේ වැඩි පරිච්ඡේද සංඛ්‍යාවක් දුටුගැමුණු රජු වෙනුවෙන් වෙන්වුවද එතුමාගේ බිසෝවරු සහ ඔහුගේ මියයාම පිළිබඳ වැඩියම් සටහනක් දක්නට නැත. එහෙත් ජනප්‍රවාදය තුළ රජුගේ මරණය පිළිබඳව ඇත්තේ වෙනස්ම කතන්දරයකි.

ගාමිණී අභය, දුෂ්ඨ ගාමිණී නම් ලත් දුටු ගැමුණු කුමරු මාගමට පලාගිය දේවානම්පියතිස්ස රජුගේ සොයුරු මහානාග රජුගේ පරපුරට අයත් කාවන්තිස්ස රජු ගේත් අභිෂෙවර හෙවත් විහාර මහා දේවියගේත් වැඩිමහල් පුත්‍රයාය. සිය මුත්තණුවන් කෙනෙකු වූ අසේල රජු ඝාතනය කොට රාජ්‍ය බලය පැහැරගනු ලැබුව වසර 44 ක් අනුරාධපුර රාජධානිය පාලනය කරා වූ එළාර රජු පරදා ශ්‍රී ලංකාද්වීපය එක්සේසත් කිරීමේ ගෞරවය මත ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම වීරයා බවට පත්වන්නේ මෙතුමාය.

රුවන්වැලි මහා සෑරදුන් ඉදිකිරීමත් සමග භික්ෂූන් වහන්සේ නමක් නා ලොවින් සර්වඥ ධාතූන් වහන්සේලා වැඩම්මවාගෙන ආ බවත්, ඉන් අනතුරුව නාගලෝකයේ පිරිස් රාත්‍රී කාලයේදී පැමින රුවන්වැලි මහා සෑය වන්දනාමාන කරගත් බවත් ජනප්‍රවාදයේ මෙන්ම ඉතිහාස මූලාශ්‍ර තුළ ද සඳහන් කොට තිබේ.

දිනක් රාත්‍රියේ සෑ රදුන් අභියස නා ලොව පුෂ්පය කඩුපුල් පුදකර තිබෙනු දැක දුටුගැමුණු රජුගේ රාජ පුරුෂයකු ඒ පිළිබඳව විසිලිමත් විය. එහි අභියස සැඟව සිටි රාජ පුරුෂයාට දක්නට ලැබුනේ ඉතාමත් රූමත් කාන්තාවක් කඩුපුල් මලින් සෑරදුන් පුදා වන්දනාමාන කරන ආකාරයයි. රාජ පුරුෂයා සැනින් රජු



සර්ප විෂ සඳහා ප්‍රතිකාරයට කීර්තිමත් කපුරුනාද නම් ජීවකවරයා කැඳවා රජුට ප්‍රතිකාර කළහ. සත් වතාවක් නාගයා රජුට දෂ්ට කළ අතර කපුරුනාද ජීවකවරයා රජු විෂහරණ බෙහෙත් ඔරුවක ගිල්වා තිල අල්ලා ඖෂධ ගල්වා සත් වතාවේදීම සුවපත් කළේය.

**දුටුගැමුණු රජුගේ මිය යාමට හේතුව පිළිබඳ නිශ්චිත තොරතුරක් නොමැති වීම ඉතිහාසය පිළිබඳව උනන්දුව දක්වන බොහෝ දෙනකුට පවතින ගැටලුවකි. මහාවංශයේ වැඩි පරිච්ඡේද සංඛ්‍යාවක් දුටුගැමුණු රජු වෙනුවෙන් වෙන් වුවද එතුමාගේ බිසෝවරු සහ ඔහුගේ මියයාම පිළිබඳ වැඩියම් සටහනක් දක්නට නැත. එහෙත් ජනප්‍රවාදය තුළ රජුගේ මරණය පිළිබඳව ඇත්තේ වෙනස්ම කතන්දරයකි.**

හමුවට ගොස් තමා දුටු දසුන පිළිබඳව රජුට සැලකල සිටියහ. කාන්තාවගේ රූපස්වභාවය පිළිබඳව අසා දැනගත් රජුට එතරම් රූමත් වූ එම කාන්තාව දැක ගැනීමට අවශ්‍ය විය. දිනක් රුවන්වැලි සෑය අභියස රැකවල්ලා සිටි පිරිස කඩුපුල් මල් පුදා සැරදුන් නමදිමින් සිටියදීම කුමරිය අල්වා බලහත්කාරයෙන්ම රජුවෙත රැගෙන ගියහ. නාග කුමරියගේ රූසෝභාවට වශී වූ රජු, කුමරිය බලහත්කාරයෙන්ම විවාහකොට ගෙන අගබිසව බවට පත්කර ගත්තේය. ඇය නා ලොව නා රජුගේ දියණියවූ කති කුමරියයි. සාලිය කුමරුගේ මව කති බිසව බවද ඇතැම් ජනප්‍රවාදයන් තුළ සඳහන් වේ.

සිය දියණිය පැහැරගත් ශෝකයත් වෛරයත් හේතුවෙන් රජුගෙන් පළිගැනීමට නා රජුට අවශ්‍ය විය. ඔහු දුටුගැමුණු රජු මරාදැමීම සඳහා නා ලොවින් නාග පුරුෂයකු පිටත්කර හැරියේය. රහසින් මාලිගයට පිවිසි නාගයා රජුට දෂ්ට කළේය. මුල්වරට රජුට දෂ්ඨ කළ අවස්ථාවේදී තමාට නාගයකු දෂ්ඨ කලබව රජු සිය ගබඩා බාර නිලමේට දන්වා සිටියහ. එහෙත් රජු මරා දැමීමට නොහැකි වූ නාග පුරුෂයා ඉන් කෝපයට පත්ව උපායක් කල්පනා කළේය. ඒ අතර දිනක් කපුරුනාද ජීවකවරයා මාලිගයෙන් බැහැරව යනු දුටු පිල්ලි නාග පුරුෂයා ඔහු පසුපස ගොස් විවේකය ගතකරන්නට ජීවක වරයා පිවිසි අම්බලමට වන්හ. එහිදී, ජීවකවරයා සමග මිතුරුව කතාබස් කිරීමේදී ඔහු රජුගේ වෛද්‍යවරයා බව හඳුනාගත් බවත් මින් පෙර නොදන්නා බවත් දක්වමින් රජුට සිදුවූ සර්ප දශ්ටනය පිළිබඳවත් ඒ සඳහා කරන ලද ප්‍රතිකාර පිලිබඳවත් තොරතුරු අසා දැන ගත්හ. එහිදී, දේශීය සර්ප විද්‍යාවේ සඳහන් වන සර්පවිෂ සුවකළ නොහැකි හා සුවකළ හැකි අවස්ථා පිළිබඳව වෛද්‍යවරයා නාග පුරුෂයාට පැහැදිලි කළේය. දශ්ට කරන විගස මිය යන ආකාරයත්, පැය කීපයකට පසුව මියයන ආකාරයත්, දින කිහිපයකට පසුව මියයන ආකාරයත් මාර යෝගය සුවපත්කළ නොහැකි බවත් වෛද්‍යවරයාගෙන්ම අසා දැනගත් ඔහු වෛද්‍යවරයා නැවත මාලිගයට පැමිණීමට දින කිහිපයක් ගතවන බව දැන වහා දුටුගැමුණු රජුගේ මාලිගයට පැමිණියේය.

වෛද්‍යවරයා ගෙන් අසා දැනගත් පරිදි මාර යෝගය අනුව දින කිහිපයකට පමණ පසු එලඹි මාසෙ පෝහෝදා මධ්‍යම රාත්‍රියේ රජුගේ යහන් ගබඩාවේ ප්‍රධාන උලුවස්ස මධ්‍යයේ සිට රජුගේ හිස මුදුණට දෂ්ට කළහ. රජු සිහිසුන් විය. බැහැර ගොස් සිටි කපුරුනාද ජීවකවරයා කඩිනමින් පැමිණ ප්‍රතිකාර කොට රජු සිහිමූර්ජාවෙන් මුදවාගත් නමුදු සර්ප දෂ්ඨනය සිදුව ඇති ආකාරය අනුව සුවකළ නොහැකි බවත් දින හතකින් රජු මිය යනබවත් දැන්විය. එය දැනගත් රජු සිය අනුප්‍රාප්තිකයා ලෙස සොයුරු සද්ධාතිස්ස කුමරු නම් කළහ. අඩක් නිමවූ රුවන්වැලි සෑ රදුන්ට නමස්කාර කරමින් ජතී ජනයා ශෝකයෙන් හඬා වැලපෙද්දී ක්‍රි.පූ.137 දී සිංහලයේ අභිමානවත් රණශූරයා ඔහු පිළිබඳව බෝසත් සංකල්පයක් ලක්වැසි ජනතාවට තබා නික්ම ගියහ. එහෙත් ශ්‍රේෂ්ඨ දුටුගැමුණු නාමය ලක් ඉතිහාසයේ ස්වර්ණ වර්ණයෙන් ලියවුණේය.


(ජනප්‍රවාද සහ ඩීපී වික්‍රමසිංහ මහතාගේ මහදිගට ජනකතා 2 කතිය මූලාශ්‍ර ඇසුරිනි)

*ඉන්දිකා ගුරුගේ - ඉතිහාසය පිළිබඳ ආචාර්යනී*
*පානදුර ශාන්ත ජෝෂප් බාලිකා විද්‍යාලය*

# නෙක්ස්ට් ජෙන් ප්‍රිමියර් ලීග් හොකී තරඟාවලිය








ශ්‍රී ලංකා නෙක්ස්ට් ජෙන් හොකී සංවර්ධන සමාජය මගින් ප්‍රථම වරට සංවිධානය කළ "නෙක්ස්ට් ජෙන්" ප්‍රිමියර් ලීග් හොකී තරඟාවලිය ඉකුත් නොවැම්බර් මස 09 වන දින කොළඹ කෘත්‍රිම හොකී තණතිල්ලේදී පැවැත්විණ. ඉන්දියානු සහ පකිස්ථානු ජාතික කණ්ඩායම්වල ක්‍රීඩකයින් හා ශ්‍රී ලංකා ක්‍රීඩා සමාජ ක්‍රීඩකයින් මේ සඳහා එක්ව තරඟ වැදුණහ.

එහිදී, තරඟාවලිය පුරාවටම සුවිශේෂී දක්ෂතා දැක්වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම කිසිදු විදේශීය ක්‍රීඩකයකු නොමැතිව තරඟ වදිමින් අවසන් තරඟයේදී ගෝල 3-2 ක් ලෙස ගුවන් හමුදා කණ්ඩායම පරදවා ජයග්‍රහණය හිමිකර ගැනීමට සමත් විය. යුද්ධ හමුදා හොකී කණ්ඩායම නියෝජනය කළ සැරයන් කුසල් තිලකසිරි අවසන් තරඟයේ හොඳම ක්‍රීඩකයා හා තරඟයේ උද්වේගකර ක්‍රීඩකයා ලෙස නම් කෙරිණ.

# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු කබඩි ශූරතාවලිය





යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු කබඩි ශූරතාවලිය ඉකුත් නොවැම්බර් මස 22 වන දින පනාගොඩ යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසලේ දී සාර්ථකව අවසන් විය. එහිදී, රෙජිමේන්තු 12 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ එම තරඟාවලියේ දී සිය දක්ෂතා විදහා දැක්වූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදා මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කබඩි කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඒඑම්කේජීපීඑස්කේ අබේසිංහ සහභාගී විය. එහිදී, උණුසුම් තරඟ මාලාවකින් පසුව, නවක පිරිමි කණ්ඩායම් තරඟයේ ශූරයන් ලෙස ඉංජිනේරු සේවා රෙජිමේන්තුව ජයග්‍රහණය කළේය. අනුශූරතාවයට ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව හිමිකම් කියූ අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය දෙවන අනුශූරතාව හිමිකර ගත්තේය.

# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු මුයිතායි ශූරතාවලිය





යුද්ධ හමුදා මුයිතායි කමිටුව විසින් සංවිධානය කරන ලද අන්තර් රෙජිමේන්තු මුයිතායි ශූරතාවලිය, පනාගොඩ යුද්ධ හමුදා බොක්සිං ශෘහස්ථ ක්‍රීඩාගාරයේ දී ඉකුත් නොවැම්බර් මස 10 වන දින පැවැත්වූ අතර, ඒ සඳහා රෙජිමේන්තු දොළහකට අයත් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 167 කට අධික පිරිසක් සහභාගී වී සිය දක්ෂතා ඉදිරිපත් කළහ.

එහි පිරිමි අංශයේ අවසන් තරගයේ දී රන් පදක්කම් 8 ක්, රිදී පදක්කම් 5 ක් සහ ලෝකඩ පදක්කම් 6 ක් දිනාගනිමින් අඛණ්ඩව තෙවැනි වරටත් විජයබාහු පාබල රෙජිමේන්තුව ශූරයන් බවට පත් විය. එමෙන්ම රන් පදක්කම් 4 ක්, රිදී පදක්කම් 4 ක් සහ ලෝකඩ පදක්කම් 8 ක් දිනාගත් ගජබා රෙජිමේන්තුව අනුශූරතාව හිමිකර ගත් අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය තෙවැනි ස්ථානය හිමිකර ගත්හ. කාන්තා අංශයේ විශිෂ්ට දක්ෂතා පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය ජයග්‍රහණය හිමිකර ගත්තේය.

මෙම උත්සව අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු සහ යුද්ධ හමුදා මුයිතායි කමිටුවේ සභාපති බ්‍රිගේඩියර් කේඩීඑම්එල් සමරදිවාකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් ජයග්‍රාහකයින් වෙත ත්‍යාග සහ කුසලාන ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාවට නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

# "B" ඛාණ්ඩයේ T20 ක්‍රිකට් තරඟාවලියේ අනුශූරතාවය යුද්ධ හමුදාවට






ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සංවිධානය කරන ලද B කාණ්ඩයේ T20 ක්‍රිකට් තරඟාවලිය - 2024, හි අනුශූරතාවය හිමිකර ගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩා සමාජය සමත්විය. එහිදී, කණ්ඩායම් රැසක් පරාජය කරමින් අවසන් තරගයට සුදුසුකම් ලැබූ යුද්ධ හමුදා කණ්ඩායම ඉකුත් නොවැම්බර් මස 17 වන දින කටුනායක ගුවන් හමුදා ක්‍රීඩාංගණයේ දී මැලේ ක්‍රිකට් කණ්ඩායම සමගින් අවසන් තරගයට පිවිස එහි අනුශූරතාවයට හිමිකම් කීය. තරගාවලියේ විශිෂ්ට දස්කම් දක්වමින් කෝප්‍රල් චන්ද්‍රබෝස් කේජීබී කඩුලු 11 ක් ලබාගනිමින් තරගාවලියේ දක්ෂතම පන්දු යවන්නා ලෙස තේරීපත් විය.

# මූලික දමිළ භාෂා පුහුණු පාඨමාලාව 2024 අධියර 11







වන්නි ආරක්ෂක සේනා ආඥාපතිගේ මඟපෙන්වීම යටතේ එම මූලස්ථානයේ බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් කේඑම්පී කොඩිතුවක්කු ගේ පූර්ණ අධීක්ෂණය මත 1 සන්නද්ධ බුද්ධි බලකාය වෙතින් පවත්වන ලද මූලික දෙමළ භාෂා පුහුණු පාඨමාලාව 2024 අධියර 11 හි සමාප්ති උත්සවය ඉකුත් නොවැම්බර් 23 වන දින එම බලකා පරිශ්‍රයේදී පැවැත්විණ. මාසයක කාලයක් පැවති මෙම පාඨමාලාවේ සමාප්ති දිනයේ එහි එක්වූ සිසු සිසුවියන් විසින් ඔවුන්ගේ දෙමළ භාෂා හැකියාව පිළිඹිබු වන පරිදි ප්‍රසංගයක් ද ඉදිරිපත් කරන ලදී. පාඨමාලාවේ විසිරයාමේ උත්සවය වන්නි ආරක්ෂක සේනා මූලස්ථාන කර්නල් ප්‍රමාති ආර්එම් සුහසිංහ ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

මෙම පාඨමාලාව සඳහා ආරක්ෂක සේනා (වන්නි) බලප්‍රදේශයේ රාජකාරී නියුතු සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් සෙබළුන් 39 ක් සහ කාන්තා සෙබළියන් 02 ක් සහභාගී වූ අතර, පාඨමාලාවේ දක්ෂතම සිසුවාට හිමි සම්මානය 2(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායෙහි සෙ/ආර්102498 කාසෙ දිල්රංගි කේජීඑන්එස් විසින් හිමිකර ගත්තාය.


# රණවිරුවා







අධීක්ෂණය

මේජර් ජෙනරාල්
කේඑච්ආර් රසික කුමාර
එන්ඩීසී පීඑස්සී





උපදේශකත්වය

ලුතිනන් කර්නල්
එම්ඩීඑස් චන්ද්‍රකුමාර
යූඑස්පී පීඑස්සී අයිජී



ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



සහය සංස්කාරක

කපිතාන්
එච්පීජේ හවන්ති

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම
සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉංජිනේරු
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉංජිනේරු

ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය
"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

ඊමේල්
dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන
011 2993076

යුධ දිගුව
51445 / 51446 / 51447

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

ප්‍රකාශනය
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය





# සෙවණක් තනා සවියක් දුන් වගයි...



මියගිය රණවිරුවකුගේ බිරිඳක් වන චංචලා චාන්දනී සපුතන්ත්‍රී සහ ඇගේ පාසල් යන පුතණුවන් වෙනුවෙන් ඉදිකරන ලද නව නිවසක් එම රණවිරු පවුල වෙත භාරදීම යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් නොවැම්බර් මස 18 වන දින සිදුකෙරිණ. දොම්පෙ ප්‍රදේශයේ ඉන්දොලමුල්ල ග්‍රාමයෙහි මෙම නිවස ඉදිකිරීම සඳහා ජාත්‍යන්තර සිංහ සමාජයේ මූල්‍ය අනුග්‍රහය ලැබිණ. යුද්ධ හමුදා 75 වන සංවත්සරයට සමගාමීව සිදුකළ මෙම නිවස භාරදීමේ කටයුත්තට ජාත්‍යන්තර සිංහ සමාජයේ 306 C 1 සිංහ දිස්ත්‍රික්කයේ සිංහාධිපති සමන් ජිනදාස මහතා ප්‍රමුඛ දියවන්නාව සිංහ සමාජයේ සාමාජික සාමාජිකාවෝ ද එක්වූහ.




ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.